VERITÉ RESEARCH
Strategic Analysis for Asia

# එන්නත්කරණ සමානාත්මතාවය කෙරෙහි වාර්ගික විවිධත්වයේ බලපෑම

2022 මාර්තු

## හැඳින්වීම

- මෙම වාර්තාව, *එන්නත්කරණ සමානාත්මතාවය කෙරෙහි වාර්ගික විවිධත්වයේ බලපෑම පිළිබඳ වැඩසටහන 2021-2022 [Diversity Impact on Vaccine Equity (DIVE) programme 2021 - 2022]* යනුවෙන් ශ්‍රී ලංකාවේ සිදු කරන ලද කොටස් දෙකකින් යුක්ත අධ්‍යයනයෙහි දෙවැනි සහ අවසන් වාර්තාව වේ. මෙය, ජාත්‍යන්තර සුළුතර අයිතිවාසිකම් සමූහය (Minority Rights Group International) වෙනුවෙන්, වෙරිටේ මීඩියා විසින් සිදු කරන ලදි.

- ශ්‍රී ලංකාවේ ප්‍රධාන වාර්ගික කණ්ඩායම් වන සිංහල, දමිළ (ශ්‍රී ලාංකික දමිළ සහ වතුකර දමිළ)[1] සහ මුස්ලිම් ප්‍රජාවන් අතර කොවිඩ්-19 එන්නත පිළිබඳව ඇති විශ්වාසය, එන්නත ලබාගැනීම සහ ඒ සඳහා ඇති ප්‍රවේශය සම්බන්ධයෙන් ඇති ආකල්පයන් සහ දක්නට ලැබෙන සංවාදයන්, මෙම අධ්‍යයනය ඔස්සේ විශ්ලේෂණයට ලක් කොට ඇත. එන්නත පිළිබඳ කටකතා, වැරදි තොරතුරු සහ අවිශ්වාසයන් දුරු කිරීම වෙනුවෙන් සිංහල හා දමිළ භාෂාවලින් සිදු කෙරෙන අන්තර්ජාල සන්නිවේදන ව්‍යාපාරයක් (online campaign) සඳහා අවශ්‍ය තොරතුරු සැපයීමත්, ශ්‍රී ලංකාව තුළ එන්නත් පිළිබඳ විශ්වාසය මෙන්ම එන්නත ලබා ගැනීම ප්‍රවර්ධනය කිරීමත් මෙම අධ්‍යයනයේ සොයාගැනීම්වල අරමුණ ලෙස පැවතිණි.

- 2021 ජනවාරි 29 වෙනි දින සිට ශ්‍රී ලංකාව කොවිඩ්-19 සඳහා වන එන්නත්කරණය ආරම්භ කරන ලදි.[i] 2022 ජනවාරි 1 දින වන විට, ශ්‍රී ලංකාවේ වයස අවුරුදු 16 ට වැඩි ජනගහනයෙන් 85.25% ක් නැතිනම් සමස්ත ජනගහනයෙන් 64.41% ක් එන්නත කොට තිබිණි.[ii] එසේම, 2021 නොවැම්බර් මස සිට ශ්‍රී ලංකාව කොවිඩ්-19 සඳහා බූස්ටර් එන්නත් මාත්‍රාව ලබාදීම ආරම්භ කර ඇත. ශ්‍රී ලංකාව ඉහළ එන්නත්කරණ ප්‍රතිශතයක් පෙන්නුම් කර තිබුණද, කොවිඩ්-19 එන්නත ලබාගැනීම සම්බන්ධයෙන් පවතින 'වැරදි තොරතුරු මත පදනම් දෙගිඩියාව' පිළිබඳව ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය බලධාරීහු නිරතුරුවම කණස්සල්ල පළ කොට ඇත.[iii]

- මෙම පසුතලයේ සිට, මෙම අධ්‍යයනය මගින් ක්‍රම දෙකක් හරහා රැස් කරගත් තොරතුරු ඇගයීමට ලක් කොට ඇත. මෙම පළමු ක්‍රමයේදී, ශ්‍රී ලංකාවේ ප්‍රධාන වාර්ගික කණ්ඩායම් අතර, කොවිඩ්-19 එන්නත පිළිබඳව වන විශ්වාසය, එන්නත ලබාගැනීම හා එන්නත් සඳහා ඇති ප්‍රවේශය පිළිබඳව අන්තර්ජාලයේ සිදු වන සංවාදයන් නිරීක්ෂණය කිරීම සහ අවබෝධ කරගැනීම සඳහා සමාජ මාධ්‍ය වෙත සවන්දීමේ හා අධීක්ෂණය කිරීමේ මෙවලම් භාවිතා කොට ඇත. වෙරිටේ මීඩියා විසින් සිදුකළ පළමු අධ්‍යයනය මගින්, ෆේස්බුක් සහ ට්විටර් පර්යන්තයන් තුළ 2021 ජනවාරි 1 සිට ඔක්තෝබර් 31 දක්වා වූ අන්තර්ජාල සංවාදයන් ඇගයීමට ලක් කොට ඇත. එම අධ්‍යයනයේ සොයාගැනීම්, *"ශ්‍රී ලංකාවේ එන්නත්කරණ සමානාත්මතාවය කෙරෙහි වාර්ගික විවිධත්වයේ බලපෑම: 2021 නොවැම්බර්"* (Diversity Impact on Vaccine Equity (DIVE) in Sri Lanka: November 2021) යන වාර්තාව ඔස්සේ ප්‍රකාශයට පත් කොට ඇත.

- සමාජ මාධ්‍ය ජාල වෙත ඇති ප්‍රවේශය සහ සමාජ මාධ්‍ය භාවිතයේ ඇති සීමාවන් හේතුවෙන්, සමාජ මාධ්‍ය අධීක්ෂණයෙන් වන සොයාගැනීම්වල විශ්වසනීයත්වය සහ වලංගුභාවය වර්ධනය කිරීම උදෙසා පැවැත්වෙන සමීක්ෂණයකට මෙහි එන දෙවැනි ක්‍රමය අදාළ වේ. ශ්‍රී ලංකා මහ බැංකුව මගින් ප්‍රකාශයට පත් කරන ලද 2020 වාර්ෂික වාර්තාවට අනුව, රටේ අන්තර්ජාල ව්‍යාප්තිය, 2020 අවසානය වන විට පුද්ගලයින් 100 දෙනෙකුට 79.9 ක් වී ඇත.[iv] ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ 2020 සඳහා වන පරිගණක සාක්ෂරතා සංඛ්‍යාලේඛන මගින් එක් එක් අංශයට අදාළව, කුටුම්භ ජනගහනය මත පදනම්ව (අවුරුදු 5 - 69 වයසැති) අන්තර්ජාල ව්‍යාප්තිය පිළිබඳව වාර්තා කරනු ලැබේ.[v] ඒ අනුව, නාගරික අංශයේ කුටුම්භ ජනගහනයෙන් 54.5%ක් අන්තර්ජාලය භාවිතා කරන අතර, ග්‍රාමීය හා වතු අංශ සඳහා මෙම අගය පිළිවෙලින් 33.3% ක් හා 13.9% ක් වේ.[vi] සැලකිය යුත්තක් ලෙසින්, වතුකර දමිළ ප්‍රජාව වැඩි වශයෙන් අයත් වන්නේ, අන්තර්ජාල භාවිතය අඩු වතු අංශයටයි. එබැවින්, සමාජ මාධ්‍ය භාවිතා නොකරන සහ/හෝ සමාජ මාධ්‍ය වෙත ප්‍රවේශය නොමැති සහ/හෝ සමාජ මාධ්‍ය අධීක්ෂණයේදී ග්‍රහණය නොවීමට ඉඩ තිබූ ජන කණ්ඩායම් වෙත ළඟා වීම සඳහා, වෙරිටේ මීඩියා වෙත මෙම සමීක්ෂණය උපකාරී වී ඇත.

- වර්තමාන අධ්‍යයනය මගින්, 2021 දෙසැම්බර් 16 සිට 2022 ජනවාරි 1 දක්වා කාලය තුළ, පුද්ගලයින් 2,476 ක් සහභාගි කර ගනිමින් සිදුකරන ලද මෙම සමීක්ෂණයේ ප්‍රධාන නිරීක්ෂණයන් සාරාංශගත කොට ඇත. එමෙන්ම, දත්ත මගින් ඊට ඉඩ සැලසෙන අවස්ථාවලදී, ඉහත සඳහන් ක්‍රම දෙක හරහා එකතු කර ගත්

1 වතුකර දමිළ ප්‍රජාවගෙන් වෙන් කර හැඳින්වීම සඳහා ශ්‍රී ලාංකික දමිළ ප්‍රජාව එලෙස ශ්‍රී ලාංකික දමිළ යනුවෙන් හඳුන්වනු ලැබේ. වතුකර දමිළ ජනතාව, ශ්‍රී ලංකාවේ කෝපි, තේ හා රබර් වතුවල සේවය කිරීම සඳහා 1837 හා 1939 කාලය අතරතුර ඉන්දියාවේ සිට මෙරටට ගෙන එනු ලැබූ සංක්‍රමණිකයින්ගෙන් පැවතෙන්නන්ගෙන් වැඩි වශයෙන් සමන්විත වේ. මෙම ප්‍රජාව, 'ඉන්දියානු දමිළ', 'ඉන්දියානු සම්භවයක් සහිත දමිළ ජාතිකයින්' හෝ 'වතුකර දමිළ ජාතිකයින්' ලෙස විවිධාකාරයෙන් හඳුන්වනු ලැබේ. වතුකර දමිළ ජනතාව සාමාන්‍යයෙන් 'මලෙයියාහා දමිළ ජාතිකයින්' (කඳුකර දමිළ ජනතාව) ලෙස තම ප්‍රජාව හඳුන්වති.

සොයා ගැනීම් අතර සමානතා හා අසමානතා හඳුනා ගැනීම සඳහා මීට පෙර පළ කරන ලද වාර්තාවේ ඇතුළත් සමාජ මාධ්‍ය අධීක්ෂණය කිරීමෙන් ලබා ගත් සොයා ගැනීම්ද මෙම වර්තමාන අධ්‍යයනය මගින් යොදා ගෙන තිබේ.

- ශ්‍රී ලංකාවේ කොවිඩ්-19 එන්නත්කරණය සම්බන්ධයෙන් වන වැරදි තොරතුරු හා අවිශ්වාසයන්ට එදිරිව කරුණු සැපයීමටත්, එන්නත පිළිබඳ විශ්වාසය හා එන්නත ලබාගැනීම ප්‍රවර්ධනය කිරීමටත් සිදුකරන ලද අන්තර්ජාල සන්නිවේදන ව්‍යාපාරය පිළිබඳ තොරතුරුද මෙම අධ්‍යයනය මගින් ඉදිරිපත් කෙරේ. සමාජ මාධ්‍ය අධීක්ෂණය සහ පෙර කී සමීක්ෂණය ඔස්සේ එක්රැස් කොට ගැනුණු දත්ත පදනම් කර ගනිමින් මෙම ව්‍යාපාරයේ උපාය මාර්ගය සැකසී ඇත.

## පර්යේෂණ ක්‍රමවේදය

### සමීක්ෂණ සැලසුම සහ නියැදි රාමුව

- ශ්‍රී ලංකාවේ  සිංහල, දමිළ සහ මුස්ලිම් ප්‍රජාවන් අතර කොවිඩ්-19 එන්නත පිළිබඳව පවතින මතයන් සහ ආකල්පයන් ඇගයුම් කිරීම සඳහා මෙම සමීක්ෂණය නිර්මාණය කරන ලදි. එම අරමුණ සාක්ෂාත් කරගැනීම උදෙසා, කොවිඩ්-19 එන්නත කෙරෙහි පවතින විශ්වාසය, එන්නත ලබාගැනීම සහ ඒ සඳහා වන ප්‍රවේශය යන කරුණු විෂයෙහි දී, අනෙකුත් කරුණු අතරම, ඒ මත වැරදි තොරතුරුවල බලපෑම, බලධාරීන් කෙරෙහි පැවති විශ්වාසය, සමීක්ෂණයට සහභාගි වූවන්ගේ ජීවිත කෙරෙහි වෛරසය මගින් ඇති කළ හැකිව තිබූ බලපෑම යන කරුණු පිරික්සා බලන ප්‍රශ්නාවලියකින් මෙම සමීක්ෂණය සැදී තිබිණි. එසේම, විවිධ සමාජ-ප්‍රජා විද්‍යාත්මක (socio-demographic) ලක්ෂණයන් (උදා: වයස, රැකියාව, අධ්‍යාපන මට්ටම ආදිය) හා යටකී අවබෝධයන් සහ ආකල්පයන් අතර පැවතිය හැකි සබඳතා ඇගයීමේ අරමුණින්, ඊට අදාළ වන සමාජ-ප්‍රජා විද්‍යාත්මක දත්ත එක් රැස් කිරීමද මෙම සමීක්ෂණය මගින් සිදු කරන ලදි.
- වයස අවුරුදු 18 හෝ ඊට වැඩි පුද්ගලයින් 2,479 ක් සමීක්ෂණයට සහභාගි වූ අතර ඔවුන් අතුරින් මෙම සමීක්ෂණය සඳහා දත්ත එක් රැස් කොට ගෙන ඇත. 2021 දෙසැම්බර් 16 සිට 2022 ජනවාරි 1 දක්වා වූ කාලසීමාව ආවරණය කරමින්, සිංහල සහ දමිළ භාෂාවන්ගෙන් මුහුණට මුහුණ පැවැත්වුණු සාකච්ඡාවන් මාර්ගයෙන් මෙම සමීක්ෂණය සිදු කරන ලදි.
- ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක 22 න් නිරූපිත නියැදියක් (respresentative sample) ගොඩ නැගීම සඳහා අරමුණු සහිත නියැදිකරණ ක්‍රමයක් (purposive sampling method) භාවිතා කරන ලදි. අඩු එන්නත්කරණ ප්‍රතිශතයක් තිබීම මත හෝ අධ්‍යයනය තුළින් අවධානය යොමු කළ ඕනෑම ජනවාර්ගික කණ්ඩායමක වැඩි සංකේන්ද්‍රණයක් තිබීම මත හෝ මෙම දිස්ත්‍රික්ක තෝරා ගැනිණි.
- බහුතර සිංහල ප්‍රජාව හා තුලනාත්මකභාවයක් තිබීම සහතික කරගනු වස්, තෝරාගත් දිස්ත්‍රික්කවලින් සමීක්ෂණයට සහභාගි වූ දමිළ හා මුස්ලිම් ජාතික පුද්ගලයින්ගේ අධිතර නියැදියක් (oversample) තිබිණි. එහිදී මෙම අධිතර නියැදියක් පවත්වා ගැනීමේ අරමුණ වූයේ, අධ්‍යයනය මගින් තක්සේරුවට ලක් වූ එක් එක් වාර්ගික කණ්ඩායමේ සමාන අනුපාතයක් ලබාගැනීමයි. ඒ අනුව, n අගය=2,479 ක් වූ නියැදියට අයත් වූ පුද්ගලයින්ගෙන් 34% ක් සිංහල, 29% ක් ශ්‍රී ලාංකික දමිළ, 3% ක් වතුකර දමිළ සහ 36% ක් මුස්ලිම් යන ජනවර්ගවලට අයත් වූහ.
- මෙහිදී ප්‍රාථමික නියැදි ඒකකය (primary sampling unit) ලෙසට දිස්ත්‍රික්කය ගෙන ඇත. අඩු කොවිඩ්-19 එන්නත්කරණ අනුපාතයන් සහිත ග්‍රාම නිලධාරී වසම් හඳුනාගැනීම සඳහා මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ගේ සහයෝගය ඇතිව ප්‍රාථමික නියැදි ඒකකයක් තුළ විවිධ උපනියැදි ඒකක නිර්මාණය කරන ලදි. සමීක්ෂණයට සහභාගි වූවන් හඳුනා ගැනීමේදී, අහඹු නියැදිකරණය (random sampling) සහ හිමබෝල නියැදිකරණය (snowball sampling) යන ක්‍රමයන්ගේ සංයෝජනයක් භාවිතා විය. එක් එක් නිවසකින් සමීක්ෂණයට සහභාගි කර ගැනීමට කෙනෙකු තෝරා ගැනීම සඳහා මෑත උපන්දින (last birthday method) ක්‍රමය යොදා ගැනිණි. එනම්, නිවසෙහි වඩාත්ම මෑතක උපන්දිනය යෙදුණු සාමාජිකයා සමීක්ෂණයට සහභාගි කර ගන්නා ලදි.

### දත්ත එක් රැස් කිරීමේ සීමාවන්

- මෙම අධ්‍යයනයේ සොයාගැනීම්, 2021 දෙසැම්බර් 16 සිට 2022 ජනවාරි 1 දක්වා කාලය තුළ එක් රැස් කෙරුණු සමීක්ෂණ දත්තවලට විශේෂිත වේ. ඒ අනුව, පසුකාලීනව කොවිඩ්-19 එන්නත්කරණය සම්බන්ධයෙන් මහජන අදහස්වල ඇති වූ වෙනස්කම් මෙම අධ්‍යයනය මගින් තක්සේරු නොකෙරේ. එපමණක් නොව, මෙම සමීක්ෂණය, රට තුළ කොවිඩ්-19 රෝගීන්ගේ සහ කොවිඩ්-19 මරණවල වැඩිවීමක් සඳහා වග කිව යුතු ඩෙල්ටා ප්‍රභේදයේ ව්‍යාප්තියෙන් පසුව සිදු කරන ලද්දකි.[vii] රටේ කොවිඩ්-19 රෝගීන්ගේ සහ කොවිඩ්-19 මරණවල වැඩිවීම හේතුවෙන්, ත්‍රිවිධ හමුදාව සහ සෞඛ්‍ය අංශ නිලධාරීන් විසින් එන්නත්කරණ වැඩසටහන වඩා ශීඝ්‍රයෙන් ඉදිරියට ගෙන යන ලදි.[viii] සමීක්ෂණයේ ඇතැම් ප්‍රශ්න සඳහා ලැබුණු ප්‍රතිචාරයන්වලට මෙම සන්දර්භය බලපා තිබීමට ඉඩ ඇත.

### සංඛ්‍යානමය විශ්ලේෂණය

සමීක්ෂණයට සහභාගි වූවන්ගෙන් ප්‍රතිචාර දක්වා නොමැති පුද්ගලයින් ඉවත් කිරීමෙන් නැතිනම් ප්‍රතිචාර අවශ්‍ය තන්හි "පිළිතුරු නොදී සිටීමට කැමැත්තෙමි" යන ප්‍රතිචාරය ලබාදී තිබූ පුද්ගලයින් ඉවත් කිරීම මගින් සමීක්ෂණ දත්ත ශෝධනය (data cleaning) කර ඇති අතර, ඒ හේතුවෙන් විශ්ලේෂිත නියැදිය පුද්ගලයින් 2,476 න් සමන්විත නියැදියක් බවට පත් විණි. "එන්නත ලබා නොගැනීමට හේතු" වැනි විවෘත ප්‍රතිචාර, එකට කාණ්ඩගත කර නැවත කේතනය කොට ඇත. විචල්‍යයන් සහ කොවිඩ්-19 එන්නත ලබා ගැනීම සම්බන්ධයෙන් පවතින දෙගිඩියාව හෝ වැරදි තොරතුරු වැනි අධ්‍යයනයේදී සැලකිල්ලක් දක්වන ප්‍රතිඵල අතර සබඳතා තක්සේරු කිරීම සඳහා, කයි වර්ග පරීක්ෂාවන් (Chi-squared tests) භාවිතා කොට ඇත. 0.05 කට වඩා අඩු $p$ අගයක් පෙන්වූ ප්‍රතිඵල මගින් සංඛ්‍යානමය වශයෙන්

වැදගත් ප්‍රතිඵල නියෝජනය වන බවට ගෙන ඇත. විචල්‍යයන් අතර සම්බන්ධතාව ස්ථාපනය කිරීමෙන් අනතුරුව හවීමාන (වාසි අවාසි) අනුපාතයන් (odds ratios) ගණනය කොට ඇත. වැරදි තොරතුරු කෙරෙහි ඉහළම දායකත්වයක් ලබාදෙන තොරතුරු මූලාශ්‍ර හඳුනා ගැනීම සඳහා, ලඝුක ප්‍රතිපායන (logistic regression) ආකෘතීන් භාවිතා කර ඇත. මෙහිදී කිසියම් ආකෘතියක් සැලකූ විට, වැරදි තොරතුරු සමඟ ඉහළ මට්ටමක සම්බන්ධතාවක් පවත්නා බවට කයි වර්ග පරීක්ෂණය ඔස්සේ තහවුරු කර ගන්නා ලද තොරතුරු මූලාශ්‍ර එම ආකෘතිය සඳහා ප්‍රථමයෙන් තෝරා ගැනිණි. මැක්ෆැඩන්ගේ ආර් වර්ග ක්‍රමය (McFadden's R-Squared) ඔස්සේ වඩාත්ම ගැලපෙන ආකෘතීන් (best-fit models) තක්සේරු කරන ලදි. සංඛ්‍යානමය වශයෙන් වැදගත් තොරතුරු මූලාශ්‍රයන් ($p$ අගය 0.05 ට අඩු සංගුණක), යම් කිසි නිශ්චිත වැරදි තොරතුරක් සඳහා මූලික වශයෙන් දායක වන මූලාශ්‍ර ලෙසින් සැලකීමට තෝරා ගැනිණි. ආකෘතියේ විශාලතම සංගුණකයන් සහිත විචල්‍යයන් තෝරාගැනීම මගින්, වැරදි තොරතුරු සඳහා ඉහළම දායකත්වයන් සපයන මූලාශ්‍ර තෝරා ගෙන ඇත.

## ප්‍රධාන සොයාගැනීම්වල සාරාංශය

### කොවිඩ්-19 එන්නත පිළිබඳ විශ්වාසය සහ එන්නත ලබාගැනීම

- සමස්තයක් ලෙසින් ගත් විට, සමීක්ෂණයට සහභාගි වූවන්ගෙන් අතිබහුතරයක් - එනම් සහභාගි වූවන්ගෙන් (n=2,476) 95.6% ක් - අඩු තරමින් කොවිඩ්-19 එන්නත්වලින් එක් මාත්‍රාවක් හෝ ලබාගෙන ඇත. කෙසේ නමුත්, එන්නතින් අඩු තරමින් එක් මාත්‍රාවක් හෝ ලබාගත් අයගෙන් 38% ක පිරිසකට, එන්නත ලබාගැනීමට පෙර එන්නත පිළිබඳ සැකසංකාවන් තිබී ඇත.

- සමීක්ෂණයට සහභාගි වූ දමිළ සහ මුස්ලිම් ජාතිකයින් එන්නත ලබා නොගෙන සිටීමට තුන්ගුණයකින් වැඩි නැඹුරුවක් දක්වා තිබිණි. එසේම, සමීක්ෂණයට සහභාගි වූ සිංහල ජාතිකයින් හා සසඳන කළ, ඔවුන් එක් එන්නත් මාත්‍රාවක් හෝ ලබාගැනීමට පෙර දෙගිඩියාවක් දැක්වීමේ පස්ගුණයක වැඩි නැඹුරුවක්ද දක්වා තිබිණි. 2021 ජනවාරි සිට ඔක්තෝබර් දක්වා කාලය තුළ සමාජ මාධ්‍ය අධීක්ෂණය කිරීම තුළින් ෆේස්බුක් හා ට්විටර් සමාජ මාධ්‍ය ජාලා හරහා එකතු කරන ලද දත්ත සමඟ මෙම සොයාගැනීම් සමපාත වේ. සිංහල සමාජ මාධ්‍ය පරිශීලකයින්ට වඩා දමිළ සහ මුස්ලිම් සමාජ මාධ්‍ය පරිශීලකයින් එන්නත පිළිබඳ අඩු විශ්වාසයක් හෝ විශ්වාසයක් නොමැති බව (එන්නත ලබා ගැනීම පිළිබඳව ඇති දෙගිඩියාව) හෝ පෙන් වූ ප්‍රකාශ සිදු කිරීමේ ඉහළ නැඹුරුවක් දක්නට ලැබිණි.

- වඩාත් තරුණ පුද්ගලයින්, එන්නත නොගෙන සිටීමට හෝ එන්නතේ එක් මාත්‍රාවක් හෝ ගැනීමට පෙරාතුව එන්නත ලබා ගැනීම සම්බන්ධයෙන් දෙගිඩියාවක් දැක්වීමට හෝ වැඩි නැඹුරුවක් පෙන්නුම් කරන ලදි.

- සමීක්ෂණයට සහභාගි වූවන් අතරින් එන්නත එතෙක් ලබාගෙන නොතිබූ, එනමුත් එන්නත ලබාගැනීමට කැමැත්තෙන් පසු වූ පුද්ගලයින් සැලකූ විට, එන්නත ලබාගැනීමෙන් වළක්වාලූ යම් බාහිර බාධකයකට (උදා: එන්නත්කරණ මධ්‍යස්ථානයකට යාමට කාලවේලාව නොතිබීම) ඔවුන් මුහුණ පා සිටීමේ ඉහළ නැඹුරුවක් පැවති බවද දක්නට ලැබිණි.

- සමීක්ෂණයට සහභාගි වූවන්ගෙන් ඉහත සඳහන් පිරිසම - එනම් එන්නත එතෙක් ලබාගෙන නොතිබූ, එනමුත් එන්නත ලබාගැනීමට කැමැත්තෙන් පසුවූවන් - යම් යම් කොවිඩ්-19 එන්නත් වර්ග සම්බන්ධයෙන් අඩු හෝ වැඩි මනාපයන්ද දක්වා තිබිණි (උදා: යම් සන්නාමයක කොවිඩ්-19 එන්නතක් ලබාගැනීමට අකමැත්තක්). සමාජ මාධ්‍ය දත්ත සැලකූ කළ, එන්නත්කරණ මට්ටම කුමක් වුවද, මෙලෙස එන්නත කෙරෙහි වරණීය කැමැත්තක් දැක්වීම මුස්ලිම් සමාජ මාධ්‍ය පරිශීලකයින්ට වඩා සිංහල හා දමිළ සමාජ මාධ්‍ය පරිශීලකයින් අතර දක්නට ලැබිණි.

### වැරදි තොරතුරු

- සමීක්ෂණයට සහභාගි වූවන් අතරින් එන්නත ලබාගෙන නොතිබූ පුද්ගලයින්, කොවිඩ්-19 එන්නත් සම්බන්ධයෙන් සෞඛ්‍යය ආශ්‍රිත වැරදි තොරතුරු (ප්‍රජනනය සහ ලිංගික සෞඛ්‍යයට බලපාන අතුරු ආබාධ වැනි) සහ දේශපාලනීකරණය වූ පණිවුඩ (රජයයන් සම්බන්ධ දේශීය හෝ ජාත්‍යන්තර කුමන්ත්‍රණ කතා) අසා තිබූ බවට දත්ත මගින් හැඟේ. මෙම වැරදි තොරතුරු ප්‍රධාන වශයෙන් 'පවුලේ සාමාජිකයින් සහ මිතුරන් සමඟ සිදු වූ සංවාද' ඔස්සේ පැතිරී තිබේ.

- එන්නත ගැනීමෙන් ඇති විය හැකි යැයි පැවසෙන ප්‍රජනනය සහ ලිංගික සෞඛ්‍යයට බලපාන අතුරු ආබාධ සම්බන්ධ වැරදි වැටහීම් විශ්වාස කිරීමේ වැඩි නැඹුරුවක් සමීක්ෂණයට සහභාගි වූ මුස්ලිම් ජාතිකයින් අතර පෙනෙන්නට තිබිණි. ඒ, සමීක්ෂණයට සහභාගි වූ සිංහල සහ දමිළ ජාතිකයින්ට සාපේක්ෂවයි. මීට සමානවම, සිංහල හා දමිළ සමාජ මාධ්‍ය පරිශීලිකයින්ට සාපේක්ෂව, මුස්ලිම් සමාජ මාධ්‍ය පරිශීලකයින් වැඩි වශයෙන් එන්නතේ ආරක්ෂිත බව ගැන සැකසංකා මතු කර තිබූ බව 2021 වර්ෂයේ ජනවාරි සිට ඔක්තෝබර් දක්වා එකතු කරන ලද ෆේස්බුක් හා ට්විටර් ඔස්සේ ලැබුණු දත්ත තුළින් පෙනී යයි.

- සමස්තයක් ලෙසින් ගත් විට, කොවිඩ්-19 සහ එන්නත්කරණ ක්‍රියාවලියට සම්බන්ධ දේශපාලනීකරණය වූ පණිවුඩ විශ්වාස කිරීමට, සමීක්ෂණයට සහභාගි වූ වාර්ගික සුළුතර ප්‍රජාවන්ට (ශ්‍රී ලාංකික දමිළ, වතුකර දමිළ සහ මුස්ලිම්) අයත් පුද්ගලයින් වැඩි නැඹුරුවක් පෙන්නුම් කර ඇත. සමාජ මාධ්‍ය දත්ත අනාවරණය කළ පරිදි, කුමන්ත්‍රණ ආශ්‍රිත බිය යන්න සුලබව හමු වූ සැකසංකා අතර තෙවැනි ස්ථානයේ පසු වූ අතර දමිළ සහ මුස්ලිම් සමාජ මාධ්‍ය පරිශීලකයින් අතර සාපේක්ෂව වැඩි වශයෙන් මෙම සැක-සංකාව දක්නට ලැබිණි.

### බලධාරීන් කෙරෙහි ඇති විශ්වාසය

- කොවිඩ්-19 එන්නත් බෙදාහැරීම සහ ලබාදීම විෂයෙහිදී, දේශ-පාලඥයින් මහජන යහපත සඳහා ඉහළින්ම සේවය කරන බවට ("මහජන යහපත ඉහළින්ම සිත් දරාගෙන") සමීක්ෂණයට

සහභාගි වූවන් තුළ පැවති විශ්වාසයට වඩා වැඩි විශ්වාසයක්, රාජ්‍ය අංශයේ සෞඛ්‍ය සේවකයින් කෙරෙහි ඔවුන් (සමීක්ෂණයට සහභාගි වූවන්) තුළ පැවතිණි.

- කොවිඩ්-19 එන්නත් බෙදාහැරීම සහ ලබාදීම විෂයෙහිදී, ත්‍රිවිධ හමුදාව සහ ප්‍රාදේශීය රාජ්‍ය නිලධාරීන් සම්බන්ධයෙන් (මහජන යහපත සඳහා ඉහළින්ම කටයුතු කරන බවට) සමීක්ෂණයට සහභාගි වූ දමිළ සහ මුස්ලිම් ජාතිකයින් අතර පැවතියේ වඩාත් අඩු විශ්වාසයකි.

## සමීක්ෂණයේ සොයාගැනීම්

- සමීක්ෂණයට සහභාගි වූවන්ගෙන් අතිබහුතරයක් - එනම් සමීක්ෂණයට සහභාගි වූවන්ගෙන් (n = 2,476) 96% ක් - කොවිඩ්-19 එන්නතෙන් අඩු තරමින් එක් මාත්‍රාවක් හෝ ලබාගෙන ඇත. සමීක්ෂණයට සහභාගි වූවන් අතරින් එන්නත්කරණය වී සිටි පුද්ගලයින් කාණ්ඩ දෙකකට බෙදන ලදි. එනම්, (1) සමීක්ෂණයට සහභාගි වූවන්ගෙන් කිසිදු සැකසංකාවකින් තොරව එන්නත ලබා ගත් පුද්ගලයින් (58%), සහ (2) සමීක්ෂණයට සහභාගි වූවන්ගෙන් එන්නත ලබා ගත්, එහෙත් එන්නත ලබාගැනීමට පෙර සැකසංකා තිබූ පුද්ගලයින් (38%) ලෙසිනි. (ප්‍රදර්ශිතය 1)

**ප්‍රදර්ශිතය 1:** කොවිඩ්-19 එන්නත්කරණ මට්ටම මත පදනම්ව, සමීක්ෂණයට සහභාගි වූවන්ගේ ව්‍යාප්තිය




*පහත සඳහන් සමීක්ෂණ ප්‍රශ්න සඳහා ප්‍රතිචාර මින් දැක් වේ:*

*Q.1.2 ඔබ ඇතුළත්ව ඔබේ නිවසේ පදිංචි පවුලේ අය අතරින් කීදෙනෙකු එන්නතේ එක් මාත්‍රාවක් හෝ ලබා ගෙන තිබේද? [සමීක්ෂණයට සහභාගි වූ සියලු දෙනාගෙන් විමසන ලදි, සමීක්ෂණයට සහභාගි වූවන්ගේ මුළු නියැදිය n=2,476]*

*Q.1.4. කොවිඩ්-19 එන්නතෙහි අවම වශයෙන් එක් මාත්‍රාවක් හෝ ගැනීමට පෙර, එන්නත ලබා ගැනීම පිළිබඳ යම් අකැමැත්තක්/අදිමදි කිරීමක් පැවතුනාද?*

*[සමීක්ෂණයට සහභාගි වූවන්ගෙන් එක් එන්නත් මාත්‍රාවක් හෝ ලබා ගත් පුද්ගලයින්ගෙන් විමසන ලදි]*

*Q.1.7. ඔබට එන්නත පහසුවෙන් ලබා ගැනීමට හැකියාව තිබුණේ නම් ඔබ එන්නත ලබා ගැනීමට කැමතිද? [සමීක්ෂණයට සහභාගි වූවන්ගෙන් එක් එන්නත් මාත්‍රාවක් හෝ ලබා නොගත් පුද්ගලයින්ගෙන් විමසන ලදි]*

*සටහන: 2021 දෙසැම්බර් 16 සිට 2022 ජනවාරි 1 දක්වා කාලය ඇතුළත මෙම අධ්‍යයනය සිදු කරන ලදි.*

- සමීක්ෂණයට සහභාගි වූවන් අතරින් 4% ක් වූ එන්නත ලබා නොගත් පුද්ගලයින් තවදුරටත් කණ්ඩායම් තුනකට වෙන් කළ හැක.[2] ඒ අනුව, පළමු කණ්ඩායම 38% ක් වන එන්නත ලබානොගත් නමුත් ලබාගැනීමට කැමැත්තෙන් පසුවන්නන්ගෙන් සැදී ඇත. දෙවැනි කණ්ඩායම 35% ක් වන එන්නත ලබා නොගෙන, ලබාගැනීමට කැමැත්තක් නොදක්වන්නන්ගෙන් සැදී ඇත. තෙවන කණ්ඩායම 27% ක් වන අතර, එය එන්නත ලබා නොගෙන, එන්නත ලබාගැනීම හෝ නොගැනීම පිළිබඳ ස්ථිර අදහසක් නොමැත්තවුන්ගෙන් සැදී ඇත.

- එන්නත පිළිබඳ විශ්වාසයට අදාළ යම් යම් දත්ත ආශ්‍රිත උපකල්පනයන් සිදු කිරීම සඳහා, සමීක්ෂණයට සහභාගි වූවන් අතරින් එන්නත ලබාගත් සහ එන්නත ලබා නොගත් පුද්ගලයින් කණ්ඩායම්ගත කළ ආකාරය මෙම අධ්‍යයනය විසින් යොදා ගැනිණි. ඒ අනුව, පූර්වයෙන් පැවති කිසිදු සැකසංකාවකින් තොරව එන්නත ලබාගැනීම යනු එන්නත පිළිබඳ ඉහළ විශ්වාසයක් තිබීම පෙන්නුම් කරන්නක් ලෙසින් මෙම විශ්ලේෂණය මගින් උපකල්පනය කරන්නේ නම්, සමීක්ෂණයට සහභාගි වූවන්ගෙන් අඩකටත් වඩා ශ්‍රී ලංකාවේ ලබාගැනීමට ඇති කොවිඩ්-19 එන්නත් සම්බන්ධයෙන් ඉහළ විශ්වාසයක් දක්වන බවක් පෙනී යයි.

- මීට ප්‍රතිවිරුද්ධ ලෙසින්, (අ) එන්නත ලබාගෙන නොතිබුණද ලබාගැනීමට කැමැත්තක් පෙන්වීම, එන්නත පිළිබඳව අඩු විශ්වාසයක් පෙන්නුම් කිරීමේ දර්ශකයක් ලෙසින් සහ, (ආ) එන්නත ලබාගැනීමට කැමැත්තක් නොපෙන්වීම යනු එන්නත පිළිබඳ කිසිදු විශ්වාසයක් නැති බව පෙන්නුම් කරන දර්ශකයක් ලෙසින් විශ්ලේෂණය මගින් උපකල්පනය කරන්නේ නම්, සමීක්ෂණයට සහභාගි වූවන්ගෙන් විශාල කොටසක් එන්නත ලබාගැනීම සම්බන්ධයෙන් දෙගිඩියාවක් දක්වන බව පෙනී යයි. එන්නත ලබා ගැනීම පිළිබඳ දෙගිඩියාව දක්වන්නවුන්ගේ ලක්ෂණ අවබෝධ කරගැනීම උදෙසා, වැඩිදුර විශ්ලේෂණයක් ලබාදී ඇත.

## කොවිඩ්-19 එන්නත ලබාගැනීම: එන්නත ලබා නොමැති අය කවුරුන් ද?

- සමීක්ෂණයට බඳුන් කළ සියලුම වාර්ගික කණ්ඩායම් අතර, කොවිඩ්-19 එන්නත් ලබාගැනීම සාමාන්‍යයෙන් ඉහළ මට්ටමක පැවතිණි. කෙසේ නමුත්, සමීක්ෂණයට සහභාගි වූවන්ගෙන් සුළුතර වාර්ගික කණ්ඩායම්වලට අයත් පුද්ගලයින්, එන්නත ලබාගෙන නොතිබීමට වැඩි නැඹුරුවක් පෙන්නුම් කර තිබිණි. එන්නත ලබාගැනීමට පෙර සැකසංකා පැවතීමේ වැඩි නැඹුරුවක්ද ඔවුන් අතර විය. (ප්‍රදර්ශිතය 2).

2 වාර්ගිකත්වය සහ එන්නත් ලබානොගැනීම සඳහා දායක විය හැකි අනෙකුත් සාධක විෂයෙහිලා මෙම කණ්ඩායම වැඩිදුර විශ්ලේෂණයට බඳුන් කිරීම, සමීක්ෂණයට සහභාගි වූවන්ගෙන් එන්නත ලබානොගත් පුද්ගලයින්ගේ නියැදියේ ප්‍රමාණය මගින් සීමා කෙරෙන බව මෙහිදී සැලකිය යුතුයි.

**ප්‍රදර්ශිතය 2:** වාර්ගිකත්වය අනුව සමීක්ෂණයට සහභාගි වූවන් කාණ්ඩගත කිරීම සහ ඔවුන්ගේ කොවිඩ්-19 එන්නත්කරණ මට්ටම




*සටහන: 2021 දෙසැම්බර් 16 සිට 2022 ජනවාරි 1 දක්වා කාලය ඇතුළත මෙම අධ්‍යයනය සිදු කරන ලදි.*

- සමීක්ෂණයට සහභාගි වූ සිංහල ජාතිකයින්ට සාපේක්ෂව, මුස්ලිම් සහ දමිළ ජාතිකයින්, එන්නත ලබා නොගෙන සිටීමේ තුන්ගුණයක වැඩි නැඹුරුවක් පවතින බවත් එන්නත ලබාගැනීමට පෙර ඒ පිළිබඳ දෙගිඩියාවෙන් සිටීමේ පස්ගුණයක වැඩි නැඹුරුවක් පෙන්නුම් කරන බවත් හව්මාන අනුපාතයන් (odds ratios) ගණනය කිරීම මගින් පෙන්වා දේ.

- මෙම සොයාගැනීම, මීට පෙර සිදු කරන ලද අධ්‍යයනය වෙනුවෙන් 2021 වර්ෂයේ ජනවාරි මාසයේ සිට ඔක්තෝබර් මාසය දක්වා සිදු කළ සමාජ මාධ්‍ය අධීක්ෂණය කිරීමේ ක්‍රියාවලිය ඔස්සේ ලබා ගත් සොයාගැනීම් සමඟ සමපාත වේ. ඒ අනුව, බහුතර සිංහල ප්‍රජාවට අයත් සමාජ මාධ්‍ය පරිශීලකයින්ට වඩා සුළුතර වාර්ගික ප්‍රජාවන්ට අයත් සමාජ මාධ්‍ය පරිශීලකයින් අතර එන්නත කෙරෙහි විශ්වාසය අඩු මට්ටම්වල පැවතීම (එන්නත ලබා ගැනීම පිළිබඳ පැවති දෙගිඩියාව) වැඩි වශයෙන් දක්නට තිබුණු බව සමාජ මාධ්‍ය අධීක්ෂණය කිරීමෙන් ලද සොයා ගැනීම් මගින් පෙන්නුම් කරන ලදි. එමෙන්ම, එන්නත කෙරෙහි ඉහළ විශ්වාසයක් පැවතීම, සුළුතර වාර්ගික ප්‍රජාවන්ට වඩා බහුතර සිංහල ප්‍රජාවට අයත් සමාජ මාධ්‍ය පරිශීලකයින් අතර වැඩි වශයෙන් නිරීක්ෂණය වූ බවද එම සමාජ මාධ්‍ය දත්ත මගින් පෙන්නුම් කරන ලදි.

- සමීක්ෂණයට සහභාගි වූවන්ගේ වයස සහ එන්නත ලබා ගැනීම පිළිබඳ පැවති දෙගිඩියාව අතර ප්‍රතිලෝම සම්බන්ධතාවක් දත්ත මගින් පෙන්වා දේ. සමීක්ෂණයට සහභාගි වූවන්ගෙන් වඩාත් තරුණ වයසේ පසුවූවන් අතර එන්නත ලබා ගැනීම පිළිබඳව පැවති දෙගිඩියාවේ ප්‍රමාණය වඩාත් ඉහළ මට්ටමක තිබූ බව දක්නට ලැබිණි. ඒ හේතුවෙන්, සාමාන්‍යයක් ලෙසින් ගත් විට, සමීක්ෂණයට සහභාගි වූවන් අතරින් එන්නත ලබා නොගත් පුද්ගලයින් තරුණ වයස් කාණ්ඩයට අයත් වීමේ වැඩි නැඹුරුවක් පෙන්නුම් කරන ලදි (වයස් මට්ටම්වල මධ්‍යස්ථය - අවුරුදු 31න් පහළ). ඊට ප්‍රතිවිරුද්ධ වශයෙන්, සමීක්ෂණයට සහභාගි වූවන් අතරින් කිසිදු සැකසංකාවකින් තොරව අඩුම තරමින් එන්නතේ එක් මාත්‍රාවක් හෝ ලබාගත් පුද්ගලයින් බොහෝ විට වයසින් වැඩි පුද්ගලයින් වීමේ වැඩි නැඹුරුවක් ඇති බවද පෙනී යයි.

- සමීක්ෂණ දත්ත විශ්ලේෂණය කිරීමේදී හෙළි වන කරුණක් වන්නේ, සමීක්ෂණයට සහභාගි වූවන්ගෙන් එන්නත ලබා නොගත් නමුත් ලබාගැනීමට කැමැත්තක් ඇති පුද්ගලයින් බොහෝ විට එන්නත ලබාගැනීමට උත්සාහ කිරීමේදී බාහිර බාධකයන්ට මුහුණ දී තිබීමේ හැකියාව වැඩි බව පෙන්නුම් කරන සාධක පවත්නා බවයි. (ප්‍රදර්ශිතය 3)

**ප්‍රදර්ශිතය 3:** සමීක්ෂණයට සහභාගි වූවන් අතරින් බාහිර බාධකයන්ට මුහුණ දුන් එන්නත ලබා නොගත් පුද්ගලයින්ගේ ව්‍යාප්තිය සහ එම බාහිර බාධක පිළිබඳ විස්තර




*Q.1.6 සඳහා ප්‍රතිචාරයන් මින් දැක් වේ: ඔබ එන්නත ලබා ගැනීමට උත්සාහ නොකිරීමට පහත සඳහන් කරුණු අතරින් බලපෑ හේතු මොනවාද? [සමීක්ෂණයට සහභාගි වූවන්ගෙන් එක් එන්නත් මාත්‍රාවක් හෝ ලබා නොගත් පුද්ගලයින්ගෙන් විමසන ලදී]*

*සටහන:*

*සමීක්ෂණයට සහභාගි වූ අයෙකුට එක් හේතුවකට වඩා ප්‍රකාශ කිරීමේ අවකාශය තිබිණි. එබැවින්, තෝරාගත් ප්‍රතිචාරවල එකතුව, ප්‍රතිචාර ලබා දුන් අයගේ සංඛ්‍යාවට වඩා වැඩි විය හැක.*

*2021 දෙසැම්බර් 16 සිට 2022 ජනවාරි 1 දක්වා කාලය ඇතුළත මෙම අධ්‍යයනය සිදු කරන ලදි.*

- එන්නත ලබා ගැනීමට යාමේදී යම් අවහිරතාවක් ඇති වන සේ, සමීක්ෂණයට සහභාගි වූ සියලුම වාර්ගික කණ්ඩායම්වල පුද්ගලයින් හට මුහුණ දීමට සිදු වන්නට ඇති බාහිර බාධක වෙත අධ්‍යයනය විසින් අවධානය යොමු කරන ලදි. සමීක්ෂණ දත්ත හරස් වගු විමසුමට ලක් කිරීමේ (cross-tabulating) ක්‍රමවේදය මෙහිදී යොදා ගැනිණි (ප්‍රදර්ශිතය 3). මෙහි ප්‍රධාන බාධකයන්ට, එන්නත් මධ්‍යස්ථානයකට යෑමට කාලවේලාවක් නොමැති වීම (13%), එන්නත නොගැනීම සඳහා [බාහිර] පීඩනයක් එල්ල වන බව හැඟීම (7%), එන්නත් මධ්‍යස්ථානයකදී එන්නත නොලැබී යෑම (6%), සහ එන්නත ලබාගැනීම සඳහා දීර්ඝ පෝලිම්වල කල් ගත කරන්නට සිදුවීම (6%) ඇතුළත් විණි.

- සමීක්ෂණ දත්ත විශ්ලේෂණය කිරීමේදී හෙළිදරව් වූයේ, සමීක්ෂණයට සහභාගි වූ, එන්නත ලබා නොගෙන එහෙත් ලබා ගැනීමට කැමැත්තෙන් සිටි (සියලුම වාර්ගික කණ්ඩායම්වලට අයත්) පුද්ගලයින් 65% ක් අතර, යම් නිශ්චිත සන්නාම සහිත කොවිඩ්-19 එන්නත් ලබා ගැනීමට කැමැත්තක් තිබීමේ වැඩි නැඹුරුවක් පැවත ඇති බවයි. මීට ප්‍රතිවිරුද්ධ ලෙසින්, සමීක්ෂණයට සහභාගි වූවන්ගෙන් එන්නත් ලබාගෙන තිබූ සහ

එන්නත් ලබා නොගෙන එහෙත් ලබාගැනීමට කැමැත්තක් නොදැක් වූ පුද්ගලයින් අතරින් එලෙස යම් නිශ්චිත එන්නත් සන්නාමයක් සම්බන්ධයෙන් කැමැත්තක් පළ කරන ලද්දේ, පිළිවෙලින් 38% ක් සහ 45% ක් පමණි (ප්‍රදර්ශිතය 4). යම් යම් එන්නත් සන්නාමයන් සම්බන්ධයෙන් සමීක්ෂණයට සහභාගි වූවන් හට තිබූ මනාපය, ඔවුන් එන්නත නොලබා සිටීම කෙරෙහි බලපෑ කරුණක් බවට පෙනෙන්නට තිබේ.

- සැලකිය යුතු ලෙසින්, එන්නත් සන්නාමයට අදාළ වරණීය කැමැත්ත පිළිබඳ සමාජ මාධ්‍ය සොයාගැනීම් මගින් අනාවරණය වූයේ, සියලුම වාර්ගික කණ්ඩායම් හරහා ඒ පිළිබඳ පළ වූ කමෙන්ටු හා ට්වීට්වල ව්‍යාප්තිය සමාන වුවද, මුස්ලිම් සමාජ මාධ්‍ය පරිශීලකයින්ට වඩා සිංහල හා දමිළ සමාජ මාධ්‍ය පරිශීලකයින් තමන් කැමති කොවිඩ්-19 එන්නත් සන්නාම ආශ්‍රිත සංවාදයන් කෙරෙහි වැඩි අවධානයක් යොමු කළ සෙයක් දක්නට තිබූ බවයි.

**ප්‍රදර්ශිතය 4:** යම් එන්නත් වර්ගයක් කෙරෙහි කැමැත්තක් දැක්වීම (එන්නත්කරණ කාණ්ඩය අනුව)




*සටහන: 2021 දෙසැම්බර් 16 සිට 2022 ජනවාරි 1 දක්වා කාලය ඇතුළත මෙම අධ්‍යයනය සිදු කරන ලදී.*

- සමීක්ෂණයට සහභාගි වූ සියලුම එන්නත්කරණ කණ්ඩායම්වලට අයත් පුද්ගලයින්, එන්නත් වර්ග සම්බන්ධයෙන් කැමැත්ත ප්‍රකාශ කිරීමේදී සයිනොෆාර්ම් එන්නත සම්බන්ධයෙන් සෘණාත්මක අදහසක් දැරීමේ වැඩි නැඹුරුවක් තිබිණි (ප්‍රදර්ශිතය 5). වෙනත් ලෙසකින් පවසන්නේ නම්, සමීක්ෂණයට සහභාගි වූවන් එක් එක් එන්නත් වර්ගය ලබා ගැනීම කෙරෙහි දැක් වූ කැමැත්ත සැලකීමේදී, අඩුම කැමැත්තක් දක්වා තිබුණේ රටේ පුළුල් ලෙසින් ලබාදුන් එන්නත වන සයිනොෆාර්ම් එන්නත ලබාගැනීමටයි. මෙම සොයාගැනීම, චීනයේ නිෂ්පාදිත සයිනොෆාර්ම් එන්නතට වඩා ඇමෙරිකානු සමාගම් විසින් නිෂ්පාදිත ෆයිසර් සහ/හෝ මොඩර්නා එන්නත් ලබා ගැනීමට මනාපය පළ කළ සමාජ මාධ්‍ය පරිශීලකයින් (සියලුම වාර්ගික කණ්ඩායම් හරහා) අතර වරණීය කැමැත්ත ඉහළ මට්ටමක තිබූ බවට පෙන්වා දුන් සමාජ මාධ්‍ය දත්ත සමග සමපාත වේ.

- සැලකිය යුතු ලෙසින්, සමීක්ෂණයට සහභාගි වූවන් අතරින්, එන්නත ලබාගෙන නොතිබූ නමුත් ලබාගැනීමට කැමැත්තෙන් සිටි අයගෙන් 53% ක්, තමන් ලබාගැනීමට අඩුම කැමැත්තක් දක්වන එන්නත ලෙසින් සයිනොෆාර්ම් එන්නත තෝරාගෙන තිබිණි. ඒ අනුව, සයිනොෆාර්ම් එන්නත ලබාගැනීම කෙරෙහි තිබූ අකැමැත්ත, ප්‍රතිචාරකයින් අතර එන්නත ලබා ගැනීම සම්බන්ධයෙන් පැවති දෙගිඩියාවට දායක වූ කරුණක් විය හැකි බව, ප්‍රදර්ශිතය 5 මගින් දක්වන සොයාගැනීම්වලින් හැඟවේ.

**ප්‍රදර්ශිතය 5:** සමීක්ෂණයට සහභාගි වූවන්ගේ එන්නත්කරණ මට්ටම හා අයත් කණ්ඩායම අනුව, ඔවුන් ලබාගැනීමට අකැමැති එන්නත් වර්ග




*සමීක්ෂණයේ Q.1.9 ප්‍රශ්නය සඳහා ප්‍රතිචාර මින් දැක්වේ: ඔබ ගැනීමට අකැමැති / අකැමැති වූ එන්නත් ඔබට නම් කළ හැකිද?*

*සටහන:*

*සමීක්ෂණයට සහභාගි වූ අයෙකු හට එන්නත් එකකට වඩා නම් කිරීමේ අවකාශය තිබිණි. එබැවින්, එක් එක් එන්නත් වර්ගය සඳහා වන එකතුව, ප්‍රතිචාර ලබා දුන් පුද්ගලයින්ගේ මුළු සංඛ්‍යාවට වඩා වැඩි විය හැක. 2021 දෙසැම්බර් 16 සිට 2022 ජනවාරි 1 දක්වා කාලය ඇතුළත මෙම අධ්‍යයනය සිදු කරන ලදී.*

## (වැරදි) තොරතුරු: පණිවුඩ සහ පණිවුඩකරුවන්

- කොවිඩ්-19 එන්නත පිළිබඳ තොරතුරු/වැරදි තොරතුරු අතරින් ඇතැම් වර්ග කිහිපයකට අයත් තොරතුරු/වැරදි තොරතුරු ඇතුළත් ජනප්‍රිය පණිවුඩ සයක් පිළිබඳ සොයාගැනීම් අංක 6 සිට 11 තෙක් වන ප්‍රදර්ශිතයන් මගින් දක්වා තිබේ. එම පණිවුඩ සය සමග කෙතරම් දුරට එකඟ වූයේද යන කරුණ සහ අ) එන්නත ලබා නොගැනීමේ චර්යාත්මක ප්‍රතිචාරයන් අතර තිබූ සබඳතාවත්, ආ) එම කරුණ සහ වාර්ගිකත්වය අතර තිබූ සබඳතාවත් මෙම ප්‍රදර්ශිත මගින් පෙන්වා දේ. සමාජ මාධ්‍ය තුළ මෙම පණිවුඩ සය සම්බන්ධයෙන් දක්නට තිබූ ඉහළ ව්‍යාප්තිය හේතුවෙන් මෙලෙස සමීක්ෂණය සඳහා එම පණිවුඩ තෝරා ගන්නා ලදී.

- සමීක්ෂණයට සහභාගි වූවන් අතරින් මෙම පණිවුඩ සමග 'තරයේ එකඟ' වන බව හෝ 'යම් තාක් දුරට එකඟ'වන බව හෝ පැවසූ පුද්ගලයින් අතර එන්නත ලබා නොසිටීමේ හෝ එක් එනනත් මාත්‍රාවක් හෝ ලබා ගැනීමට පෙර එන්නත ලබා ගැනීම පිළිබඳ දෙගිඩියාවෙන් සිටීමේ නැඹුරුතාව ඉහළ මට්ටමක තිබූ බවට

ප්‍රබල සාක්ෂි තිබිණි.

- ඉහත ආකාරයට කොවිඩ්-19 එන්නත ලබා ගැනීම සම්බන්ධයෙන් පැවති දෙගිඩියාව සහ පණිවුඩ සඳහා පළ කරන ලද එකඟත්වය සමඟ සහසම්බන්ධතාවක් (correlate) පෙන්වීමේ ප්‍රවණතාවක් දැක් වූ පණිවුඩ සය, ආකාර දෙකක් අනුව වර්ගීකරණය කළ හැක. පළමු ආකාරය වූයේ ප්‍රජනනය සහ ලිංගික ගැටළු පිළිබඳ සෞඛ්‍යය ආශ්‍රිත විශ්වාසයන්ය. දෙවැනි ආකාරය වූයේ කොවිඩ්-19 සහ එන්නත්කරණ ක්‍රියාවලිය සම්බන්ධ දේශපාලනීකරණය වූ විශ්වාසයන්ය. සමීක්ෂණයට සහභාගි වූවන් කොවිඩ්-19 එන්නත සම්බන්ධයෙන් තොරතුරු/උපදෙස් විමසා සිටි ඔවුන්ගේම මිතුරන් හා පවුලේ සාමාජිකයින් හරහා මූලික වශයෙන්ම මෙම දෙයාකාරයේම පණිවුඩ ප්‍රචාරය වී තිබීම සැලකිය යුතු කරුණකි.
- සමීක්ෂණයට සහභාගි වූවන් අතර පැවති එන්නත ලබා ගැනීම පිළිබඳව තිබූ දෙගිඩියාවේ මට්ටම සමඟ සහසම්බන්ධතාවක් පෙන්නුම් කරන සෞඛ්‍යය ආශ්‍රිත පණිවුඩවලට, වඳභාවය, ගර්භණී මවුවරුන්ට අත්විඳින්නට සිදුවෙතැයි පැවසුණු අතුරු ආබාධ සහ ලිංගික ක්‍රියාකාරිත්වයට අදාළ අතුරු ආබාධ පිළිබඳ බිය ඇතුළත් විණි (ප්‍රදර්ශිත 6 සිට 8 දක්වා).
- කොවිඩ්-19 එන්නත කෙරෙහි පැවති විශ්වාසය සහ එන්නත ලබාගැනීම සමඟ සහසම්බන්ධතාවක් පෙන්නුම් කරන දේශපාලනීකරණය වූ පණිවුඩවලට, මෙම වෛරසය යනු ප්‍රබල රටවල් මගින් නිර්මිත කුමන්ත්‍රණයක් බවත්, බටහිර රටවල් (එක්සත් ජනපදය සහ එක්සත් රාජධානිය) මගින් නිෂ්පාදිත එන්නත් චීනයේ නිෂ්පාදිත එන්නත් හා සසඳන විට ඉහළ සඵලකාරිත්වයකින් යුතු බවත්, රජයේ එන්නත්කරණ වැඩසටහන මගින් සමාජයේ යම් යම් කොටස් කොන් කිරීමකට ලක් කළ බවත් ඇතුළත් විණි (ප්‍රදර්ශිත 9 සිට 11).
- මෙම පණිවුඩ සය විශ්ලේෂණය කිරීම ඔස්සේ, සමීක්ෂණයට සහභාගි වූ සිංහල, දමිළ සහ මුස්ලිම් ප්‍රජාවන්ට අයත් පුද්ගලයින් විසින් එම පණිවුඩ පිළිගත් මට්ටම් කෙබඳුද යන වගද හෙළිදරව් විණි. ඒ අනුව, සිංහල සහ දමිළ ජාතික පුද්ගලයින් හා සසඳන කළ, එන්නත් ලබාගැනීම ඔස්සේ ප්‍රජනන සහ ලිංගික අතුරු ආබාධ ඇති විය හැකි බවට වූ වැරදි අවබෝධයන් විශ්වාස කිරීමට, සමීක්ෂණයට සහභාගි වූ මුස්ලිම් ජාතිකයින් වැඩි නැඹුරුවක් පෙන්නුම් කර තිබිණි. මුස්ලිම් සමාජ මාධ්‍ය පරිශීලකයින් විසින්ද මෙම අදහස් පළ කර තිබූ බව 2021 දී සිදු කරන ලද සමාජ මාධ්‍ය අධීක්ෂණය තුළින් නිරීක්ෂණය විය. ඒ අනුව, කොවිඩ්-19 එන්නත පිළිබඳ සැකසංකා පළ කළ කමෙන්ට් හා ට්වීට්වල ව්‍යාප්තිය වාර්ගික කණ්ඩායම් අතර සාපේක්ෂ වශයෙන් සමාන වුවද, සිංහල හා දමිළ සමාජ මාධ්‍ය පරිශීලකයින්ට සාපේක්ෂව මුස්ලිම් සමාජ මාධ්‍ය පරිශීලකයින් එන්නතේ ආරක්ෂිත බව පිළිබඳ වැඩි වශයෙන් සැකංසංකා පළ කර තිබිණි.
- සමස්තයක් ලෙසින් ගත් විට, කොවිඩ්-19 සහ එන්නත්කරණ ක්‍රියාවලියට සම්බන්ධ දේශපාලනීකරණය වූ පණිවුඩ විශ්වාස කිරීමට, සමීක්ෂණයට සහභාගි වූවන් අතරින් වාර්ගික සුළුතර ප්‍රජාවන්ට (ශ්‍රී ලාංකික දමිළ, වතුකර දමිළ සහ මුස්ලිම්) අයත් පුද්ගලයින් වැඩි නැඹුරුවක් පෙන්නුම් කරන ලදි. මෙම ප්‍රජාවන්ගෙන් වතුකර දමිළ සහ මුස්ලිම් කණ්ඩායම්, කොවිඩ් - 19 වෛරසය යනු ප්‍රබල රටවල් මගින් නිර්මිත කුමන්ත්‍රණයක් මිස අන්තරායකර වෛරසයක් නොවන බවට විශ්වාස කිරීමට වැඩි නැඹුරුවක් දක්වා තිබිණි. ඒ අනුව, ඔවුන් එන්නතක අවශ්‍යතාව විශ්වාස කිරීමට අඩු නැඹුරුවක්ද පෙන්නුම් කරන ලදි. සමීක්ෂණයේ මෙම සොයා ගැනීම, සමාජ මාධ්‍ය පරිශීලකයින් විසින් එන්නත පිළිබඳ පළ කරන සැකසංකා හා සම්බන්ධ සමාජ මාධ්‍ය සොයාගැනීම් සමඟ සමපාත වේ. සමාජ මාධ්‍ය දත්ත අනාවරණය කළ පරිදි, 'කුමන්ත්‍රණ ආශ්‍රිත බිය' යන්න සුලබව හමු වූ සැකසංකා අතර තෙවැනි ස්ථානයේ පසු වූ අතර සුළුතර ප්‍රජාවන්ට අයත් සමාජ මාධ්‍ය පරිශීලකයින් අතර සාපේක්ෂව වැඩි වශයෙන් මෙම සැකසංකාව දක්නට ලැබිණි.

**ප්‍රදර්ශිතය 6:** එන්නත්කරණ මට්ටම මත 'කොවිඩ්-19 එන්නත වඳ භාවයට හේතු විය හැක' යන පණිවුඩය හා එකඟ වීමේ බලපෑම හා වාර්ගිකත්වය




*සමීක්ෂණයේ Q.7.2 ප්‍රශ්නය සඳහා ප්‍රතිචාර මින් දැක් වේ: 1 සිට 5 දක්වා පරිමාණයෙන්, ඔබ කොවිඩ්-19 එන්නත් පිළිබඳ පහත ආකල්ප සහ විශ්වාසයන් ශ්‍රේණිගත කරන්නේ කෙසේදැයි සඳහන් කරන්න. [සමීක්ෂණයට සහභාගි වූවන් අතරින් මීට පෙර මෙම පණිවුඩය අසා තිබූ පුද්ගලයින්ගෙන් විමසන ලදී]*

*සටහන: 2021 දෙසැම්බර් 16 සිට 2022 ජනවාරි 1 දක්වා කාලය ඇතුළත මෙම අධ්‍යයනය සිදු කරන ලදී.*

*Icon credit: Cuputo; The Noun Project*

**ප්‍රදර්ශිතය 7:** එන්නත්කරණ මට්ටම කෙරෙහි 'කොවිඩ්-19 එන්නත ගර්භණී සහ කිරි දෙන මව්වරුන් සඳහා ආරක්ෂිත නොවේ' යන පණිවුඩය හා එකඟ වීමේ බලපෑම සහ වාර්ගිකත්වය




*සමීක්ෂණයේ Q.7.2 ප්‍රශ්නය සඳහා ප්‍රතිචාර මින් දැක් වේ: 1 සිට 5 දක්වා පරිමාණයෙන්, ඔබ කොවිඩ්-19 එන්නත් පිළිබඳ පහත ආකල්ප සහ විශ්වාසයන් ශ්‍රේණිගත කරන්නේ කෙසේදැයි සඳහන් කරන්න. [සමීක්ෂණයට සහභාගි වූවන් අතරින් මීට පෙර මෙම පණිවුඩය අසා තිබූ පුද්ගලයින්ගෙන් විමසන ලදී]*

*සටහන: 2021 දෙසැම්බර් 16 සිට 2022 ජනවාරි 1 දක්වා කාලය ඇතුළත මෙම අධ්‍යයනය සිදු කරන ලදී.*

*Icon credit: Cuputo; The Noun Project*

**ප්‍රදර්ශිතය 8:** එන්නත්කරණ මට්ටම කෙරෙහි 'කොවිඩ්-19 එන්නත ලිංගික දුර්වලතාවන්ට හේතු විය හැක' යන පණිවුඩය හා එකඟ වීමේ බලපෑම සහ වාර්ගිකත්වය




*සමීක්ෂණයේ Q.7.2 ප්‍රශ්නය සඳහා ප්‍රතිචාර මින් දැක් වේ: 1 සිට 5 දක්වා පරිමාණයෙන්, ඔබ කොවිඩ්-19 එන්නත් පිළිබඳ පහත ආකල්ප සහ විශ්වාසයන් ශ්‍රේණිගත කරන්නේ කෙසේදැයි සඳහන් කරන්න. [සමීක්ෂණයට සහභාගි වූවන් අතරින් මීට පෙර මෙම පණිවුඩය අසා තිබූ පුද්ගලයින්ගෙන් විමසන ලදි]*

*සටහන: 2021 දෙසැම්බර් 16 සිට 2022 ජනවාරි 1 දක්වා කාලය ඇතුළත මෙම අධ්‍යයනය සිදු කරන ලදි.*

*Icon credit: Cuputo; The Noun Project*

**ප්‍රදර්ශිතය 9:** එන්නත්කරණ මට්ටම කෙරෙහි 'කොවිඩ්-19 යනු අන්තරායකර වෛරසයක් නොව ප්‍රබල රටවල් මගින් නිර්මාණය කරන ලද කුමන්ත්‍රණයක් ය' යන පණිවුඩය හා එකඟ වීමේ බලපෑම සහ වාර්ගිකත්වය




*සමීක්ෂණයේ Q.7.2 ප්‍රශ්නය සඳහා ප්‍රතිචාර මින් දැක් වේ: 1 සිට 5 දක්වා පරිමාණයෙන්, ඔබ කොවිඩ්-19 එන්නත් පිළිබඳ පහත ආකල්ප සහ විශ්වාසයන් ශ්‍රේණිගත කරන්නේ කෙසේදැයි සඳහන් කරන්න. [සමීක්ෂණයට සහභාගි වූවන් අතරින් මීට පෙර මෙම පණිවුඩය අසා තිබූ පුද්ගලයින්ගෙන් විමසන ලදි]*

*සටහන: 2021 දෙසැම්බර් 16 සිට 2022 ජනවාරි 1 දක්වා කාලය ඇතුළත මෙම අධ්‍යයනය සිදු කරන ලදි.*

*Icon credit: Cuputo; The Noun Project*

**ප්‍රදර්ශිතය 10:** එන්නත්කරණ මට්ටම කෙරෙහි 'චීනයේ නිෂ්පාදිත එන්නත්වලට සාපේක්ෂව බටහිර රටවල (ඇමෙරිකාව සහ එක්සත් රාජධානිය) නිෂ්පාදිත එන්නත්වල ඉහළ සඵලකාරිත්වයක් ඇත' යන පණිවුඩය හා එකඟ වීමේ බලපෑම සහ වාර්ගිකත්වය




*සමීක්ෂණයේ Q.7.2 ප්‍රශ්නය සඳහා ප්‍රතිචාර මින් දැක් වේ: 1 සිට 5 දක්වා පරිමාණයෙන්, ඔබ කොවිඩ්-19 එන්නත් පිළිබඳ පහත ආකල්ප සහ විශ්වාසයන් ශ්‍රේණිගත කරන්නේ කෙසේදැයි සඳහන් කරන්න. [සමීක්ෂණයට සහභාගි වූවන් අතරින් මීට පෙර මෙම පණිවුඩය අසා තිබූ පුද්ගලයින්ගෙන් විමසන ලදී]*

*සටහන: 2021 දෙසැම්බර් 16 සිට 2022 ජනවාරි 1 දක්වා කාලය ඇතුළත මෙම අධ්‍යයනය සිදු කරන ලදී.*

*Icon credit: Cuputo; The Noun Project*

**ප්‍රදර්ශිතය 11:** එන්නත්කරණ මට්ටම කෙරෙහි 'රජයේ එන්නත්කරණ වැඩසටහන මගින් සමාජයේ යම් යම් ජන කොටස් කොන් කිරීමට ලක් කෙරේ' යන පණිවුඩය හා එකඟ වීමේ බලපෑම සහ වාර්ගිකත්වය




*සමීක්ෂණයේ Q.7.2 ප්‍රශ්නය සඳහා ප්‍රතිචාර මින් දැක් වේ: 1 සිට 5 දක්වා පරිමාණයෙන්, ඔබ කොවිඩ්-19 එන්නත් පිළිබඳ පහත ආකල්ප සහ විශ්වාසයන් ශ්‍රේණිගත කරන්නේ කෙසේදැයි සඳහන් කරන්න. [සමීක්ෂණයට සහභාගි වූවන් අතරින් මීට පෙර මෙම පණිවුඩය අසා තිබූ පුද්ගලයින්ගෙන් විමසන ලදී]*

*සටහන: 2021 දෙසැම්බර් 16 සිට 2022 ජනවාරි 1 දක්වා කාලය ඇතුළත මෙම අධ්‍යයනය සිදු කරන ලදී.*

*Icon credit: Cuputo; The Noun Project*

### බලධාරීන් කෙරෙහි විශ්වාසය: කොවිඩ්-19 එන්නත් බෙදාහැරීමේදී සහ ලබාදීමේදී මහජනතාවගේ යහපත හොඳින්ම සැලකිල්ලට ගෙන ඇත්තේ කවුරුන්ද?

- ප්‍රදර්ශිතය 12 මගින් පෙන්නුම් කර ඇති ආකාරයට, කොවිඩ්-19 එන්නත් බෙදාහැරීමේදී සහ ලබාදීමේදී මහජනතාවගේ යහපත සඳහා කටයුතු කිරීම සම්බන්ධයෙන් ගත් විට, සමීක්ෂණයට සහභාගී වූවන් තුළ අවම විශ්වාසයක් පැවතියේ දේශපාලන චරිත කෙරෙහිය. මෙම දේශපාලන චරිතවලට ජනපති ගෝඨාභය රාජපක්ෂ, සෞඛ්‍ය ඇමති කෙහෙලිය රඹුක්වැල්ල සහ අනෙකුත් ප්‍රාදේශීය දේශපාලඥයින් හා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් ඇතුළත් විණි.
- කොවිඩ්-19 එන්නත් බෙදාහැරීමේදී සහ ලබාදීමේදී රජයේ සෞඛ්‍ය අංශ සේවකයින් මහජනතාවගේ යහපත සඳහා කටයුතු කරන්නේ යැයි, සමීක්ෂණයට සහභාගි වූවන් තුළ වඩාත් ඉහළ විශ්වාසයක් දක්නට ලැබිණි. මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්, ප්‍රදේශයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන්, රජයේ වෛද්‍යවරුන් සහ හෙද නිලධාරීන්, මෙම සෞඛ්‍ය අංශයේ රාජ්‍ය බලධාරීන් යන කොටසට ඇතුළත් විණි.

**ප්‍රදර්ශිතය අංක 12:** බලධාරීන් කෙරෙහි ඇති විශ්වාසය ව්‍යාප්ත වී ඇති ආකාරය




*සමීක්ෂණයේ Q.9 ප්‍රශ්නය සඳහා ප්‍රතිචාර මින් දැක් වේ: කොවිඩ්-19 එන්නත බෙදා හැරීමේදී සහ ලබා දීමේදී පහත බලධාරීන් ඔබේ යහපත ගැන සිතන බව ඔබට කොතරම් විශ්වාසද යන්න 1 සිට 5 දක්වා පරිමාණයන්ගෙන් ශ්‍රේණිගත කරන්න. [සමීක්ෂණයට සහභාගි වූ සියලු දෙනාගෙන් විමසන ලදි].*

*සටහන: 2021 දෙසැම්බර් 16 සිට 2022 ජනවාරි 1 දක්වා කාලය ඇතුළත මෙම අධ්‍යයනය සිදු කරන ලදි.*

- බලධාරීන් මහජනතාවගේ යහපත සිත්හි දරා ගෙන කටයුතු කරන බවට සමීක්ෂණයට සහභාගි වූවන් දැක් වූ විශ්වාසයේ මට්ටම, වැඩසටහනට සම්බන්ධ වීම විෂයෙහි මෙම බලධාරීන් කෙරෙහි ඇති මහජන විශ්වාසයේ දර්ශකයක් ලෙසින් මෙම අධ්‍යයනය මගින් භාවිතා කොට ඇත. ඒ අනුව, බලධාරීන් මහජනතාවගේ යහපත සිත්හි දරා ගෙන කටයුතු කරන බවට ඉහළ විශ්වාසයක් පළ කළ ප්‍රතිචාර මගින් බලධාරීන් කෙරෙහි ඇති විශ්වාසය දැක්වෙන බවට මෙම විශ්ලේෂණයේදී අර්ථ නිරූපණය කර ඇත. එමෙන්ම, බලධාරීන් මහජනතාවගේ යහපත සිත්හි දරා ගෙන කටයුතු කිරීම සම්බන්ධයෙන් අඩු විශ්වාසයක් පළ කළ ප්‍රතිචාර මගින් බලධාරීන් කෙරෙහි ඇති අවිශ්වාසය දැක්වෙන බවට විශ්ලේෂණය මගින් අර්ථ නිරූපණය කොට ඇත. ඒ අනුව, සමීක්ෂණයට සහභාගි වූවන්, සෞඛ්‍ය අංශයේ සේවය කරන රාජ්‍ය බලධාරීන් විසින් මෙහෙයවූ කොවිඩ්-19 එන්නත්කරණ ක්‍රියාකාරකම් පිළිබඳ වැඩි විශ්වාසයක් තැබීමේ ප්‍රවණතාවක් පවත්නා බව මෙම සොයාගැනීම් තුළින් හැඟේ.
- යම් යම් රාජ්‍ය බලධාරීන් විෂයෙහි ගත් විට, සමීක්ෂණයට සහභාගි වූ සිංහල, දමිළ හා මුස්ලිම් ජාතිකයින් අතර විශ්වාසය පිළිබඳ විවිධ මට්ටම් තිබූ බව මෙම දත්ත වඩාත් සමීපව ඇගයීමේදී හෙළිදරව් විණි. සමීක්ෂණයට සහභාගි වූ සිංහල ජාතිකයින් හා සංසන්දනයේදී, දමිළ හා මුස්ලිම් ජාතිකයින් අතර, ත්‍රිවිධ හමුදාව සහ ප්‍රාදේශීය රාජ්‍ය නිලධාරීන් (උදා: ප්‍රාදේශීය ලේකම්වරු) එන්නත් බෙදාහැරීමේදී සහ ලබාදීමේදී මහජනතාවගේ යහපත ඉහළින් සලකා කටයුතු කරන්නේද යන්න පිළිබඳව පැවතියේ වඩා අඩු විශ්වාසයකි (ප්‍රදර්ශිතය අංක 13).[ix]

**ප්‍රදර්ශිතය 13:** වාර්ගිකත්වය අනුව ත්‍රිවිධ හමුදාව සහ ප්‍රාදේශීය රාජ්‍ය නිලධාරීන් කෙරෙහි ඇති විශ්වාසය ව්‍යාප්ත වී ඇති ආකාරය




*සටහන: 2021 දෙසැම්බර් 16 සිට 2022 ජනවාරි 1 දක්වා කාලය ඇතුළත මෙම අධ්‍යයනය සිදු කරන ලදී.*

## කොවිඩ්-19 එන්නත පිළිබඳ විශ්වාසය සහ එන්නත් ලබාගැනීම ප්‍රවර්ධනය සඳහා වන අන්තර්ජාල සන්නිවේදන ව්‍යාපාරය

2022 පෙබරවාරි 22 වැනි දින, ශ්‍රී ලංකාවේ පුරවැසියන් අතර කොවිඩ්-19 එන්නත්කරණය පිළිබඳ විශ්වාසය හා එන්නත ලබාගැනීම ප්‍රවර්ධනය කිරීම සඳහා සිංහල හා දමිළ භාෂාවන්ගෙන් අන්තර්ජාල සන්නිවේදන ව්‍යාපාරයක්, වෙරිටේ මීඩියා මගින් දියත් කෙරිණි. මෙම ව්‍යාපාරය, වෙරිටේ මීඩියා මගින් හසුරුවනු ලබන පර්යන්තයන් දෙකක් වන එතික්ස් අයි සහ FactCheck.lk ඔස්සේ ෆේස්බුක්, ටිවිටර් සහ ඉන්ස්ටාග්‍රෑම් හරහා මෙන්ම වෙරිටේ රිසර්ච්හි සමාජ මාධ්‍ය ගිණුම් හරහාද සිදු කෙරිණි.[x]

(අ) සමාජ මාධ්‍ය අධීක්ෂණයෙන්, (ආ) සමීක්ෂණය මගින්, සහ (ඇ) නිල රාජ්‍ය දත්ත මගින් ලබාගත් සොයාගැනීම් ඔස්සේ, මෙම ව්‍යාපාරයේ උපාය මාර්ගය දැනුම්වත් වී තිබිණි. මෙම සොයාගැනීම් මගින් අනාවරණය වූයේ, ජනගහනයේ යම් කොටස් අතර එන්නත්කරණය පිළිබඳ විශ්වාසය ඌණ වීමට, කොවිඩ්-19 එන්නත් පිළිබඳ වැරදි තොරතුරු ප්‍රධාන සාධකයක් ලෙසින් දායක වී ඇති බවයි. ඒ අනුව, කොවිඩ්-19 එන්නත සම්බන්ධ කටකතා, වැරදි තොරතුරු සහ අවිශ්වාසයට එදිරිව කරුණු දැක්වීම සඳහා මෙම ව්‍යාපාරය අවධානය යොමු කර තිබිණි. සැලකිය යුතු පරිද්දෙන්, කොවිඩ්-19 එන්නත් පිළිබඳ අඩු මට්ටමක වූ විශ්වාසයේ ප්‍රතිඵලයක්ද පෙනෙන්නට තිබේ; ඒ අනුව, බූස්ටර් එන්නත ලබාගැනීම සඳහා අඩු පුද්ගලයින් සංඛ්‍යාවක් ඉදිරිපත් වීම කෙරෙහි බලධාරීන් 'සංවිධානාත්මක' වැරහි තොරතුරු ව්‍යාපාරයන් වෙත දෝෂාරෝපණය එල්ල කර ඇත.[xi]

වෙරිටේ මීඩියා විසින් සිදු කරන ලද අන්තර්ජාල සන්නිවේදන ව්‍යාපාරය, ප්‍රධාන වශයෙන් කොවිඩ්-19 එන්නත් හා සබැඳි ප්‍රධාන, සෞඛ්‍යය ආශ්‍රිත වැරදි තොරතුරු දෙකක් ආමන්ත්‍රණය කිරීම කෙරෙහි අවධානය යොමු කළේය. එනම්, (1) එන්නත ගැනීමෙන් ඇතිවිය හැකි යැයි සිතන ප්‍රජනන සහ ලිංගික ගැටළු කෙරෙහි වන බිය (විශේෂයෙන්ම වඳභාවය හා ලිංගික දුර්වලතා), සහ (2) එන්නත ගැනීමෙන් ඇතිවිය හැකි යැයි සිතන අහිතකර අතුරු ආබාධ කෙරෙහි වන බිය ලෙසින් දැක්විය හැක.

මෙම වැරදි වැටහීම් නැති කිරීම සඳහා, වෙරිටේ මීඩියා මගින්, ශ්‍රී ලාංකික වෛද්‍යවරුන් විසින් මෙම සෞඛ්‍ය මත පදනම් වැරදි තොරතුරු ප්‍රසිද්ධියේ නිශ්ප්‍රභ කරන අයුරු සඵලකාරීව සහ යෝග්‍ය ලෙසින් පෙන්වා දෙන වීඩියෝ, සිංහල සහ දමිළ භාෂාවන්ගෙන් භාවිතා කොට ඇත. එන්නත්කරණ වැඩසටහනේ කොටස්කරුවන් වන අනෙකුත් නිලධාරීන්ට වඩා, රජයේ වෛද්‍යවරුන් සහ හෙද නිලධාරීන් සම්බන්ධයෙන් මහජනතාව තුළ ඉහළ විශ්වාසයක් පවත්නා බව සමීක්ෂණ සොයාගැනීම් මගින් පෙන්නුම් කිරීම හේතුවෙන් මෙම වීඩියෝ තෝරාගනු ලැබිණි.

මෙම ව්‍යාපාරය මගින්, ශ්‍රී ලංකාවේ වයස අවුරුදු 31 ට අඩු අන්තර්ජාල පරිශීලකයින් ඉලක්ක කොටගෙන තිබේ. සමීක්ෂණයට සහභාගි වූවන්ගෙන් එන්නත ලබා නොගත් පිරිස අතර මධ්‍යස්ථ වයස් මට්ටම සාමාන්‍යයෙන් අවුරුදු 31 ට අඩු බව සමීක්ෂණ සොයාගැනීම් මගින් හෙළිදරව් වී තිබූ හෙයින් මෙම වයස් සීමාව තෝරා ගන්නා ලදී. එසේම මෙම ව්‍යාපාරය, කොවිඩ්-19 එන්නතේ දෙවැනි මාත්‍රාව ලබාගත් ප්‍රතිශතය 60% කට අඩු අගයක් පෙන් වූ සහ ප්‍රධාන ධාරාවේ මාධ්‍ය මගින් එන්නත් පිළිබඳ සැකසංකා ලක්ෂණ පෙන් වූ බවට ඉස්මතු කර දැක් වූ දිස්ත්‍රික්ක හා නගරවල අන්තර්ජාල පරිශීලකයන්ද ඉලක්ක කොටගෙන තිබිණි.[xii] [3] ඒ අනුව, කොළඹ, කිලිනොච්චිය, මුලතිවු, වවුනියාව, යාපනය, මඩකළපුව සහ කළුතර යන දිස්ත්‍රික්කද, කල්මුණේ නගරයද තෝරාගැනී තිබිණි. මෙම ඉලක්කගත ස්ථානයන් සහ කණ්ඩායම් වෙත ළඟා වීම සඳහා, වෙරිටේ මීඩියා මගින් ෆේස්බුක් හා ඉන්ස්ටාග්‍රෑම්හි ඉලක්කගත ඉහළ නැංවීමේ (targeted boosting) පහසුකම භාවිතා කර තිබිණි.[4]

3 ඉලක්කගත දිස්ත්‍රික්ක සහ නගර, ඌණ එන්නත්කරණ අනුපාතයක් සහිත සහ/හෝ මෙම වැඩසටහන දියත් වූ අවස්ථාවේදී එන්නත්කරණය පිළිබඳ සැකසංකාවන්ගේ ලකුණු පෙන්නුම් කළ ප්‍රදේශ ලෙසින් හඳුනා ගැනී තිබිණි. මෙම පෙදෙස් තුළ මෙම වැඩසටහන දියත් වීමෙන් පසුව එන්නත්කරණ අනුපාතයන් ඉහළ ගොස් තිබිය හැක.

4 වෙරිටේ මීඩියා යනු පුවත් ප්‍රකාශකයෙකු නොවන අතර, ට්විටර් පර්යන්තයේ දේශපාලන අන්තර්ගත ප්‍රකාශන ප්‍රතිපත්තියෙන් (political content advertisement policy) නිදහස් වී නොමැත. ඒ අනුව, ඔවුන්ට ට්විටර් හි කොවිඩ්-19 ආශ්‍රිත අන්තර්ගතයන් ඉහළ නැංවීමේ (boost) හැකියාව නොමැත.

2022.03.21 දිනට එක් එක් පර්යන්තය සඳහා වීඩියෝ සඳහා ලැබුණු ප්‍රචාරය පිළිබඳ සාරාංශයක් පහත දක්වා ඇත:

| වීඩියෝව | පළ කළ දිනය | ෆේස්බුක් ප්‍රචාරය (reach) | | | ට්විටර් ප්‍රචාරය (impressions) | | | ඉන්ස්ටාග්‍රෑම් ප්‍රචාරය (reach) |
|---|---|---|---|---|---|---|---|---|
| | | වෙරිටේ රිසර්ච් | Fact-Check.lk | එතික්ස් අයි | වෙරිටේ රිසර්ච් | Fact-Check.lk | එතික්ස් අයි | |
| ලිංගික ගැටළු ආශ්‍රිත සැකසංකා (දමිළ බස) | 22.02.2022 | 79,405 | 30,937 | 131 | 473 | 187 | 193 | 20,403 |
| ලිංගික ගැටළු ආශ්‍රිත සැකසංකා (සිංහල බස) | 22.02.2022 | 108,215 | 1,196 | 175 | 380 | 263 | 1,342 | 27,296 |
| අතුරු ආබාධ පිළිබඳ සැකසංකා (දමිළ බස) | 10.03.2022 | 1,191 | 4,694 | 42 | (FactCheck.lk වෙතින් නැවත ට්වීට් කරන ලදි) | 181 | 57 | 11,248 |
| අතුරු ආබාධ පිළිබඳ සැකසංකා (සිංහල බස) | 10.03.2022 | 4,734 | 2,313 | 46 | (FactCheck.lk වෙතින් නැවත ට්වීට් කරන ලදි) | 946 | 83 | 13,282 |

## නිගමනය

ශ්‍රී ලංකාවේ සිංහල, දමිළ සහ මුස්ලිම් ප්‍රජාවන් අතර කොවිඩ්-19 එන්නත පිළිබඳව ඇති විශ්වාසය, එය ලබාගැනීම සහ ඒ සඳහා ඇති ප්‍රවේශය සම්බන්ධයෙන් ඇති අවබෝධයන් සහ ආකල්පයන් විමර්ශනය කිරීම සඳහා මෙම අධ්‍යයනය සිදු කරන ලදි. මෙම අධ්‍යයනයේ සොයාගැනීම් ඔස්සේ අනාවරණය වූයේ, ශ්‍රී ලංකාවේ කොවිඩ්-19 වසංගතය හඳුනාගෙන වසර දෙකක් ගත වී තිබුණද, කොවිඩ්-19 එන්නත පිළිබඳ විශ්වාසය සහ එය ලබාගැනීම වළක්වාලන වැරදි වැටහීම් මේ දක්වා පැවත ඇති බවයි. කෙසේ නමුත්, මෙම වැරදි වැටහීම් රට පුරා කුඩා කණ්ඩායම්වලට පමණක් සීමා වන අතර, වාර්ගික සුළුතර ප්‍රජාවන් අතර එය වැඩි වශයෙන් දක්නට තිබේ.

මෙම අධ්‍යයනයේ සොයාගැනීම් තුළින් ශ්‍රී ලංකාවේ ප්‍රධාන වාර්ගික කණ්ඩායම් අතර කොවිඩ්-19 එන්නත පිළිබඳව පවතින ආකල්ප සහ විශ්වාසයන් අවබෝධ කර ගැනීමට දායකත්වයක් ලැබිය හැක. වඩාත් වැදගත් ලෙසින්, මෙම අධ්‍යයනය මගින්, කොවිඩ්-19 එන්නත් පිළිබඳ විශ්වාසයේ සහ එන්නත් ලබාගැනීමේ මට්ටම සම්බන්ධව, අනෙකුත් කරුණුවලට අමතරව, වැරදි තොරතුරු ඔස්සේ ඇතිවී තිබෙන විශ්වාසයන්ගේ බලපෑම ගෙන හැර දක්වයි. එමෙන්ම, එන්නත ලබා ගැනීම පිළිබඳව ඇති දෙගිඩියාව දුරු කිරීම වෙනුවෙන් ගන්නා පියවර තුළදී වාර්ගිකත්වය හා ආගමික විශ්වාසයන් හා සම්බන්ධ ගැටළු වෙත අවධානය යොමු කොට නොතිබීම හේතුවෙන් සුළුතර ප්‍රජාවන්ට විශේෂිත වන වැදගත් වෙනස්කම් සඳහා එම වැඩසටහන් තුළ ඉඩක් නොලැබ යෑමේ අවදානමක් පවතින බවද එමගින් පෙන්වා දේ. මෙම අධ්‍යයනයේ සොයාගැනීම් ශ්‍රී ලාංකීය සන්දර්භයට විශේෂිත වුවත්, මෙම අධ්‍යයනයෙන් සොයා ගැනුණු වැරදි වැටහීම්, ඇතැම් විට ලොව පුරා ජනගහනය තුළ පැතිර පවතිනු විය හැක. ඒ අනුව, ගෝලීය වශයෙන් කොවිඩ්-19 එන්නත් ලබාගැනීම වැඩිදියුණු කිරීම උදෙසා සඵලකාරී සන්නිවේදන ව්‍යාපාර සහ මැදිහත් වීමේ උපාය මාර්ග සැලසුම් කිරීම සඳහා, සන්ධර්භය ආශ්‍රිතව සමාන සාධක පවතින හෝ සමාන වැරදි වැටහීම් දක්නට ලැබෙන හෝ රටවල් වඩාත් හොඳින් දැනුම්වත් කිරීමට හැකියාව මෙම අධ්‍යයනයේ සොයාගැනීම්වලට ඇත.

# අන්ත සටහන්

**i.** රාජ්‍ය බුද්ධි සේවාව, 'කොවිඩ්-19 එන්නත්කරණයේ ශ්‍රී ලාංකීය ප්‍රවේශය (Covid-19 Vaccination Sri Lankan Approach)', ශ්‍රී ලංකා ජනාධිපති ලේකම් කාර්යාලය, 2021 අගෝස්තු 24, ප්‍රවේශය: http://www.presidentsoffice.gov.lk/.Documents/Concept%20Paper-COVID%2019_Vaccination-Sri_Lankan_Approach.pdf [අවසන් වරට ප්‍රවේශය: මාර්තු 1, 2022].

**ii.** වෙරිටේ රිසර්ච් ඉදිරිපත් කරන Factcheck.lk,'කෙහෙලිය රඹුක්වැල්ල: එන්නත් මාත්‍රා දෙකම ලබාදීම සම්බන්ධයෙන්, ශ්‍රී ලංකාව ලෝකයේ 4 වෙනි ස්ථානයට ශ්‍රේණිගත වී ඇත (Keheliya Rambukwella: Sri Lanka ranked 4th in the world in terms of administering both doses)' ප්‍රවේශය: http://factcheck.lk/claim/keheliya-rambukwella-6 [අවසන් වරට ප්‍රවේශය: මාර්තු 1, 2022].

**iii.** 'ඔමික්‍රෝන් ප්‍රභේදය ව්‍යාප්ත වීමත් සමග බූස්ටර් එන්නත පිළිබඳ දෙගිඩියාවක් තිබීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා සෞඛ්‍ය බලධාරීන් කණස්සල්ලෙන් (Sri Lanka health authorities worried over booster hesitancy as Omicron spreads)', ඉකොනොමිනෙක්ස්ට්, 2022 ජනවාරි 6, ප්‍රවේශය: https://economynext.com/sri-lanka-health-authorities-worried-over-booster-hesitancy-as-omicron-spreads-89373/ [අවසන් වරට ප්‍රවේශය: මාර්තු 1, 2022].

'ශ්‍රී ලංකාවේ එන්නත් පිළිබඳ දෙගිඩියාව පැතිර යෑම: බලධාරීන් සංවිධානාත්මක ව්‍යාපාරයන්ට දොස් පවරයි (Creeping vaccine hesitancy in Sri Lanka: authorities blame organised campaign)', ඉකොනොමිනෙක්ස්ට්, 2021 සැප්තැම්බර් 28, ප්‍රවේශය: https://economynext.com/creeping-vaccine-hesitancy-in-sri-lanka-authorities-blame-organised-campaign-86540/ [අවසන් වරට ප්‍රවේශය: මාර්තු 1, 2022]

**iv.** ශ්‍රී ලංකා මහ බැංකුව, '2020 වාර්ෂික වාර්තාව - 3 වන පරිච්ඡේදය', ප්‍රවේශය: https://www.cbsl.gov.lk/sites/default/files/cbslweb_documents/publications/annual_report/2020/en/7_Chapter_03.pdf [අවසන් වරට ප්‍රවේශය: මාර්තු 1, 2022]

**v.** ශ්‍රී ලංකාවේ ජනලේඛන සහ සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, 'පරිගණක සාක්ෂරතා සංඛ්‍යාලේඛන'(Computer Literacy Statistics) (2020 ජනවාරි සිට දෙසැම්බර්), ප්‍රවේශය http://www.statistics.gov.lk/Resource/en/ComputerLiteracy/Bulletins/AnnualBuletinComputerLiteracy-2020#:~:text=Overall%20Computer%20Literacy%20reported%20in,between%202017%20to%202020%20period [අවසන් වරට ප්‍රවේශය: මාර්තු 1, 2022]

**vi.** එම.

**vii.** ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ වෙබ් අඩවිය, ශ්‍රී ලංකාව, 'ශ්‍රී ලංකාවේ කොවිඩ්-19 ආසාදනයන්ගෙන් 95.8%කට වගකිව යුත්තේ ඩෙල්ටා ප්‍රභේදයයි (Delta variant was responsible for 95.8% of Covid-19 infections in Sri Lanka) - අසාත්මිකතා, ප්‍රතිශක්ති විද්‍යා හා සෛල ජෛව විද්‍යායතනය, ජ'පුර විශ්වවිද්‍යාලය', 2021 සැප්තැම්බර් 9, ප්‍රවේශය: https://www.sjp.ac.lk/news/delta-variant-was-responsible-for-95-8-of-covid-19-infections-in-sri-lanka-allergy-immunology-cell-biology-unit-usj/ [අවසන් වරට ප්‍රවේශය: මාර්තු 1, 2022].

සෞඛ්‍ය අමාත්‍යාංශයේ වසංගත රෝග විද්‍යා අංශය, ශ්‍රී ලංකාව 'කොරෝනා වෛරස් රෝගය 2019 (COVID-19) - තත්ව වාර්තාව - 16.12.2021 - 10 a.m.', ප්‍රවේශය: https://epid.gov.lk/web/images/pdf/corona_virus_report/sitrep-sl-en-16-12_10_21.pdf [අවසන් වරට ප්‍රවේශය: මාර්තු 1, 2022].

**viii.** යුමිකෝ පෙරේරා, 'කොවිඩ්-19 එන්නත්කරණ වැඩසටහන: වේගවත් වැඩසටහනක් හරහා විශිෂ්ට ප්‍රගතියක් (Covid-19 vaccination programme: Great progress through accelerate drive)', ද මෝර්නින්ග්, 2021 අගෝස්තු 14, ප්‍රවේශය: https://www.themorning.lk/covid-19-vaccination-programme-great-progress-through-accelerated-drive/ [අවසන් වරට ප්‍රවේශය: මාර්තු 1, 2022].

**ix.** දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙබ් අඩවිය - මොණරාගල, ප්‍රවේශය:http://monaragala.dist.gov.lk/index.php/en/ [අවසන් වරට ප්‍රවේශය: මාර්තු 1, 2022]

දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙබ් අඩවිය - යාපනය, ප්‍රවේශය: Divisional Secretariat—Jaffna—Home (ds.gov.lk) [අවසන් වරට ප්‍රවේශය: මාර්තු 1, 2022].

**x.** වෙරිටේ රිසර්ච්හි FactCheck.lk පර්යන්තයේ ෆේස්බුක් පිටුව, 'කොවිඩ්-19 එන්නත පිළිබඳව පවතින වැරදි තොරතුරුවලට එදිරිව කරුණු සැපයීම', ප්‍රවේශය https://fb.watch/bTiMVmESM9/, https://fb.watch/bw31Dabf-7/, https://fb.watch/bZKi70bWcl/ සහ https://fb.watch/bTiUc-KI01/ [අවසන් වරට ප්‍රවේශය: මාර්තු 23, 2022].

වෙරිටේ රිසර්ච්හි FactCheck.lk පර්යන්තයේ ට්විටර් පිටුව, 'කොවිඩ්-19 එන්නත පිළිබඳව පවතින වැරදි තොරතුරුවලට එදිරිව කරුණු සැපයීම', ප්‍රවේශය https://twitter.com/factchecklka/status/1495944455379365892, https://twitter.com/factchecklka/status/1495944926294597638, https://twitter.com/factchecklka/status/1501900941729034242 සහ https://twitter.com/factchecklka/status/1501902275320578049 [අවසන් වරට ප්‍රවේශය: මාර්තු 23, 2022].

එතික්ස් අයි (Ethics Eye) හි ෆේස්බුක් පිටුව, 'කොවිඩ්-19 එන්නත පිළිබඳව පවතින වැරදි තොරතුරුවලට එදිරිව කරුණු සැපයීම', ප්‍රවේශය https://fb.watch/bWFUCq8HZS/, https://fb.watch/bw3cU_qV9s/, https://fb.watch/bWI_Jh9ijg/ සහ https://fb.watch/bWJ0glFLM0/ [අවසන් වරට ප්‍රවේශය: මාර්තු 23, 2022].

එතික්ස් අයි (Ethics Eye) හි ෆේස්බුක් පිටුව, 'කොවිඩ්-19 එන්නත පිළිබඳව පවතින වැරදි තොරතුරුවලට එදිරිව කරුණු සැපයීම', ප්‍රවේශය https://twitter.com/EthicsEye/status/1495968202244902912, https://twitter.com/EthicsEye/status/1495969980734660608, https://twitter.com/EthicsEye/status/1504652459032997892 සහ https://twitter.com/EthicsEye/status/1504654820967268366 [අවසන් වරට ප්‍රවේශය: මාර්තු 23, 2022].

වෙරිටේ රිසර්ච්හි ෆේස්බුක් පිටුව, 'කොවිඩ්-19 එන්නත පිළිබඳව පවතින වැරදි තොරතුරුවලට එදිරිව කරුණු සැපයීම', ප්‍රවේශය https://fb.watch/bWGrl_UzEk/, https://fb.watch/c2Acp-45jEK/, https://fb.watch/bWGAykUyxL/ සහ https://fb.watch/bWGxMPUIaT/ [අවසන් වරට ප්‍රවේශය: මාර්තු 23, 2022].

වෙරිටේ රිසර්ච්හි ට්විටර් පිටුව, 'කොවිඩ්-19 එන්නත පිළිබඳව පවතින වැරදි තොරතුරුවලට එදිරිව කරුණු සැපයීම', ප්‍රවේශය https://twitter.com/VeriteResearch/status/1495989229230465025, https://twitter.com/VeriteResearch/status/1495989582743347203 [අවසන් වරට ප්‍රවේශය: මාර්තු 23, 2022].

වෙරිටේ රිසර්ච්හි ඉන්ස්ටාග්‍රෑම් ගිණුම, 'කොවිඩ්-19 එන්නත පිළිබඳව පවතින වැරදි තොරතුරුවලට එදිරිව කරුණු සැපයීම', ප්‍රවේශය https://bit.ly/36f4wqM, https://bit.ly/3D8w10X, https://bit.ly/36jDzlu සහ https://bit.ly/3ulH17h [අවසන් වරට ප්‍රවේශය: මාර්තු 23, 2022].

**xi.** 'බූස්ටර් එන්නත පිළිබඳව ශ්‍රී ලංකාවේ දෙගිඩියාව ඇතිවීමට බිල්ලන් මැවීම හේතු වී ඇත: වෛද්‍ය සංගමය (Scaremongering has led to booster hesitation in Sri Lanka (doctors union)', ඉකොනොමිනෙක්ස්ට්, 2021 දෙසැම්බර් 29, ප්‍රවේශය: https://economynext.com/scaremongering-has-led-to-booster-hesitation-in-sri-lanka-doctors-union-89148/ [අවසන් වරට ප්‍රවේශය: මාර්තු 1, 2022].

'ශ්‍රී ලංකාවේ එන්නත් පිළිබඳ දෙගිඩියාව පැතිර යෑම: බලධාරීන් සංවිධානාත්මක ව්‍යාපාරයන්ට දොස් පවරයි (Creeping vaccine hesitancy in Sri Lanka (authorities blame organized campaign)', ඉකොනොමිනෙක්ස්ට්, 2021 සැප්තැම්බර් 28, ප්‍රවේශය: https://economynext.com/creeping-vaccine-hesitancy-in-sri-lanka-authorities-blame-organised-campaign-86540/ [අවසන් වරට ප්‍රවේශය: මාර්තු 1, 2022].

**xii.** නිදහසේ මෙහෙයුම කොවිඩ්-19 ට එරෙහි ක්‍රියාන්විතය (Operation Freedom Immunizing Sri Lanka) වෙබ් අඩවිය, 'එන්නත්කරණ සංඛ්‍යාලේඛන', ප්‍රවේශය: https://covid19.gov.lk/vaccination-statistics.html [අවසන් වරට ප්‍රවේශය: මාර්තු 1, 2022].

සෞඛ්‍ය අමාත්‍යාංශයේ වසංගත රෝග විද්‍යා අංශ වෙබ් අඩවිය, ශ්‍රී ලංකාව, ප්‍රවේශය: https://www.epid.gov.lk/web/index.php?lang=en [අවසන් වරට ප්‍රවේශය: මාර්තු 1, 2022].

## ස්තූතිය

මෙම අධ්‍යයනය, ජාත්‍යන්තර සුළුතර අයිතිවාසිකම් සමූහය (Minority Rights Group International) සඳහා වෙරිටේ මීඩියා මගින් සම්පාදනය කරන ලදි. සමීක්ෂණය ක්‍රියාත්මක කිරීමේ හවුල්කරු ලෙසින් වැන්ගාඩ් සර්වේ (පුද්.) සමාගම කටයුතු කරන ලදි. මෙම අධ්‍යයනයේ ප්‍රධාන පර්යේෂිකාව සහ කතුවරයා ලෙසින් මහෝෂධී පීරිස් කටයුතු කරන ලදි. රථිකා ප්‍රනාන්දු එහි පර්යේෂණ කළමනාකාරිණියයි. අශ්වින් පෙරේරා සමීක්ෂණ දත්තවල ප්‍රමාණාත්මක ඇගයුම ලබා දුන් ප්‍රධාන දත්ත විශ්ලේෂක විය. මූලික පර්යේෂණ සහය රථිකා ප්‍රනාන්දු, දේශිත කදිරගොන්න, ෂිහාරා ෆර්ඩිනැන්ඩු සහ ගෞරි සැමුවෙල් විසින් ලබා දී ඇත. ස්ටෙෆනි නිකෝල් සහ සුරේශ් යෝගසුන්දරම් විසින් මෙම අධ්‍යයනයේ භාෂා සංස්කරණය සිදු කරන ලදි. සමස්ත පර්යේෂණ අධීක්ෂණය නිශාන් ද මැල් සහ දීපාංජලී අබේවර්දනගෙනි. සමීක්ෂණය ක්‍රියාත්මක කිරීම සඳහා නායකත්වය වැන්ගාඩ් සර්වේ වෙනුවෙන් මහේන් මුත්තයියා විසින් ලබා දෙන ලදි. දත්ත සටහන් සැකසුම නිලංගිකා ප්‍රනාන්දු විසිනි. නිමැවුම් සැකසුම දිනුක් සෙනාපතිරත්න විසින් සිදුකර ඇත. මෙහි නම් සඳහන් වූවන් විසින් අධ්‍යයනයේ මුල් කෙටුම්පත් හා අදහස් විමංසනය සඳහා කැප කළ කාලය පිළිබඳවත්, ඔවුන්ගේ ප්‍රතිචාර පිළිබඳවත් කතුවරයා ඔවුනට අතිශයින්ම කෘතඥ වේ.

minority rights group international

*මෙම ලේඛනයේ අන්තර්ගතය පිළිබඳ වගකීම හුදෙක්ම වෙරිටේ රිසර්ච් ආයතනය වෙත පැවරී තිබෙන අතර කිසිදු අවස්ථාවක එය මයිනොරිටි රයිට්ස් ගෲප් ඉන්ටර්නැෂනල් සංවිධානයේ මතය පිළිඹිබු කරන්නක් ලෙසට සැලකිය නොයුතුය.*